ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"..... දෙවියන් වහන්සේ ප්‍රේමයය. ප්‍රේමයෙහි පවතින්නා දෙවියන් වහන්සේ තුළ සිටී. දෙවියන් වහන්සේද, ඔහු තුළ සිටින සේක." (1 යොහාන් 4 : 16)

82 වන වෙළුම අංක 06 (972) **2023 නොවැම්බර් / දෙසැම්බර් මාස**

නුඹ මට ප්‍රේම කරනවාද ... ?

ඒ.බී. සිම්ප්සන් විසිනි.

යේසුස් වහන්සේ නැවත නැගිටුණු පසු උන්වහන්සේගේ ගෝලයන්ට ප්‍රකාශ වෙමින්, පේත්‍රුස්ගෙන් තියුණු ප්‍රශ්නයක් ඇසූ අතර එය අපගේ ස්වාමීන් වහන්සේගේ පාවාදීමේ රාත්‍රියේදී පේත්‍රුස්ගේ අසාර්ථකත්වය යෝජනා කරමින් සිහිපත් කරනු ලබයි.

"මෙසේ ඔවුන් කෑ පසු යේසුස් වහන්සේ සීමොන් පේත්‍රුස්ට කථාකොට, යොහාන්ගේ පුත්‍ර වූ සීමොන් මොවුන්ට වඩා නුඹ මට ප්‍රේමකරනවාදැයි ඇසූ සේක. ඔහු එසේය. ස්වාමීනි, මා ඔබට ආදරේ ඇති බව ඔබ දන්නාසේකැයි උන්වහන්සේට කීවේය. උන්වහන්සේ, මාගේ බැටළු පැටවුන් පෝෂණය කරපන්නැයි ඔහුට කී සේක. නැවතත් දෙවෙනි වරක්, යොහාන්ගේ පුත්‍ර වූ සීමොන් නුඹ මට ප්‍රේම කරනවාදැයි ඔහුගෙන් ඇසූ සේක. ඔහු එසේය ස්වාමීනී, මා ඔබට ආදරේ ඇති බව ඔබ දන්නාසේකැයි උන්වහන්සේට කීවේය. උන්වහන්සේද, මාගේ බැටළුවන් පාලනය කරපන්නැයි ඔහුට කී සේක. උන්වහන්සේ තුන්වෙනි වර ඔහුට කථාකොට යොහාන්ගේ පුත්‍ර වූ සීමොන් නුඹ මට ආදරේ දැයි ඔහුගෙන් ඇසූ සේක. තුන්වෙනි වර මට ආදරේ දැයි යේසුස් වහන්සේ තමන්ගෙන් ඇසූ බැවින් පේත්‍රුස් දුකට පැවිණ ස්වාමීනි, ඔබ සියල්ල දන්නා සේක. මා ඔබට ආදරේ ඇති බව ඔබ දන්නා සේකැයි උන්වහන්සේට කීවේය. යේසුස් වහන්සේ ඔහුට කථාකොට මාගේ බැටළුවන් පෝෂණය කරපන්න." (යොහාන් 21:15-17)

නුඹ මට ප්‍රේමකරනවාද .. ? යන ප්‍රශ්නය පේත්‍රුස්ගෙන් ඇසීම ක්‍රිස්තුස් වහන්සේට වැදගත්ව සහ සියල්ලට වඩා ඇගවීමක් ලබාදීමට අවශ්‍ය වූ සේක. අපගේ මිතුරන් අපගේ පක්ෂාපතීත්වය සහ සෙනෙහස ගැන සැක කිරීම තරම් දරුණු තුවාලයක් තවත් නැත. පේත්‍රුස් තුන්වරක්ම යේසුස් වහන්සේව අදුණන්නේ නැහැ කියා උන්වහන්සේව ප්‍රතික්ෂේප කිරීම හඟවා දෙමින් යේසුස් වහන්සේ තුන්වරක්ම එම ප්‍රශ්නය ඇසීමෙන් ප්‍රශනයේ ස්වරූපය අවධාරණය විය.

ප්‍රේමයේ අසාර්ථකවීම්

යේසුස් වහන්සේ මෙම ප්‍රශ්නය අපෙන් අසන්නේ අපගේ අසාර්ථකත්වයන් අනුවය. රළු ලෙස නොව විචිත්‍රවත් මෘදු මොළොක් බවකින් උන්වහන්සේ අපගේ ද්‍රෝහිකම (අවිශ්වාසවන්තකම) ගැන අපට මතක්කර දෙන අතර එය අපගේ හෘදය සාක්ෂියේ සහ හදවතේ ගැඹුරට ළඟාවන තෙක් නැවත නැවතත් එය අප වෙතට යොමු කරවන සේක. ඇත්තටම අපගේ අසාර්ථකත්වයේ ප්‍රධාන වන්නේ ප්‍රේමයේ අසාර්ථකවීම් නොවේද ..? මෙය ජීවිතයේ සහ චරිතයේ උත්තරීතර පරීක්ෂණය නොවේද ..? අපගේ සියළු වැරදි සහ අසාර්ථකත්වයන් යේසුස් ක්‍රිස්තුස් වහන්සේට ඇති ප්‍රේමයේ හිඟකම සහ ආත්මාර්ථකාමීත්වයේ ආත්මය නොවේද ... ? උන්වහන්සේගේ කැමැත්ත සහ උන්වහන්සේගේ ප්‍රේමයේ උත්තරීතර ප්‍රකාශයන්ට වඩා අඩු දෙයක් සලකා බැලීමක් නොවේද .. ?

එසේ වුවත් අපගේ අසාර්ථකත්වයන් උන්වහන්සේට වඩා වැඩියෙන් ප්‍රේම කිරීමට අවස්ථාවක් ලෙස නිර්මාණය කරනු ලබන සේක. උන්වහන්සේ අපට කොපමණ වාරයක් සමාවදී තිබෙනවාද ..? උන්වහන්සේ කොපමණ කාලයක් අපව ඉවසා දරා සිටිනවාද ..? උන්වහන්සේ අපට ඉගැන්වීමට උත්සාහ කළ පාඩම් ඉගෙන ගැනීමටත්, උන්වහන්සේගේම දුකවිඳීමේ මතකයන් සහ සිතුවිලිවලින් උන්වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට අපි නැගී සිටින තෙක් අප ගැන කොපමණ ඉවසිලිවන්තව බලා සිටියාද .... ? උන්වහන්සේගේ ප්‍රේමයෙන්, අපගේ සියලු කෘතඥතාවය නොදැක්වීම්, නොසැලකිලිමත්කම්, අපගේ ප්‍රේමයේ හීනවීම් මකාදමනු ලබන සේක. එබැවින් මෙලෙස ඔබ මට ප්‍රේම කරනවාද කියා අපෙන් අසන්නේ කවුද ..?

අපගේ ආදරය මත උන්වහන්සේගේ අයිතිය ප්‍රකාශ කිරීම.

මෙම ප්‍රශ්නය අපගේ ආදරය පිළිබඳව උන්වහන්සේගේ ප්‍රකාශය යෝජනා කරයි. අපගේ උත්තරීතර භක්තියට හිමිකම් කිමේ අයිතිය ඇතිව මේ උතුම් වූ ස්වාමීන් වහන්සේ අප ඉදිරියේ ප්‍රකාශ වන සේක. ආත්මාර්ථකාමී නොවී තමන් වහන්සේ ගැන කථා කිරීමට උන්වහන්සේට හැකිව සිටින අතර අතිශෝක්තියෙන් තොරව අපගේ සෙනෙහසට උන්වහන්සේගේ අයිතිය ඉදිරිපත් කළ හැකි වන්නේ උන්වහන්සේට පමණි. තම පියාණන් වහන්සේගේ සිංහාසනය අතහැර පහත්ම ස්ථානයට පැමිණ කුරුසියේ ලැජ්ජාව සහ වේදනාව දරාගෙන උන්වහන්සේ අපට කොපමණ ප්‍රේම කළ සේක්ද...? ඔබ ගැන සිතූ සහ ඔබගේ පැවැත්ම ආරම්භවීමට පෙර ඔබ වෙනුවෙන් මිය ගිය තැනැත්ත වහන්සේ උන්වහන්සේය. ඔබව නිර්මාණය කර උන්වහන්සේව දැන ගැනීමට සහ උන්වහන්සේගේ කරුණාව ලබා ගැනීමට කැඳවූයේ උන්වහන්සේය. ඔබට ඉගැන්වූ, ඔබට මඟ පෙන්වූ, ඔබට ප්‍රේම කළ, බොහෝ විට ඔබව ගලාගත්, බොහෝ විට ඔබව යථාතත්ත්වයට පත් කළ , උන්වහන්සේගේ ආශිර්වාදයේ සම්පූර්ණත්වයට ඔබව ගෙනා උන්වහන්සේගේ කරුණාවේ වස්තුව ඔබට ලබා දුන්, ඔබගේ හදවත තුළ වාසය කිරීමට පැමිණෙන, ඔබගේ රෝග සුවකළ, ඔබගේ වේදනාවන්, දුක දරාගෙන උන්වහන්සේගේ මහිමයේ වස්තුව ඔබ වෙනුවෙන් සූදානම් කරමින් උන්වහන්සේගේ සේවයේ සහ රාජ්‍යයේ හවුල්කාරීත්වයෙන් ඔබට ගෞරව කරන තැනැත්ත වහන්සේ අද දවසේදීත් ඔබගෙන් අසන්නේ ඔබ මට ප්‍රේමකරනවාද කියාය.

උන්වහන්සේ අලංකාරව, තේජාන්විතව පරිපූර්ණව ප්‍රේමණීයව සිටින සේක. උන්වහන්සේ තම මහිමය සහ උන්වහන්සේගේ කරුණාව ප්‍රකාශ කළ ඕනෑම අයෙකුගෙන් ඔබ මට ප්‍රේම කරනවාද කියා ඇසීමට සිදුවන්නේ ඇයි ? උන්වහන්සේ තමන් වහන්සේගේ වඩා සමීප ඇසුරට ගෙන ආ සහ උන්වහන්සේගේ ප්‍රේමයේ රහස් දන්වා ඇති කෙනෙකුගෙන් ඔබ මට ප්‍රේමකරනවාදැයි අසන්නේ ඇයි ? මාගේ අනර්ඝ වූ දරුව...., ඔබ මට ප්‍රේම කරනවාද කියා ප්‍රේත්‍රුස්ගෙන් ඇසීම අපගේ හදවත් පාහේ බිඳ දැමීමට පුදුමයක් නොවේ.

මොවුන්ට වඩා...,

මොවුන්ට වඩා නුඹ මට ප්‍රේම කරනවාද ... ? යන ප්‍රශ්නය උන්වහන්සේගේ උතුම් වූ ප්‍රේමයෙන් අපගේ හදවත් වෙන් කිරීම සහ උන්වහන්සේගේ අයිතිය ප්‍රකාශ කරීම සමඟ තරඟවදින බව හඟවා දෙයි. මොවුන්ට වඩා යන්නෙන් අදහස් කරන්නේ අනෙකුත් සියලුම මිතුරන් හෝ අනෙකුත් සියලුම ගෝලයන් විය හැකිය. මක්නිසාද අනිත් සියල්ලන්ම උන්වහන්සේ අත්හැර ගියත් තමන් එසේ නොකරන බව ප්‍රේත්‍රුස් පුරසාරම් දෙඩෙව්වේය. නමුත් වඩාත් සත්‍යය වශයෙන්ම එයින් අදහස් කරන්නේ ප්‍රේත්‍රුස් ප්‍රේම කළ සියළුදේ වන අතර එය ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රකාශනයන් හා ප්‍රේමය සමඟ තරඟයට ගෙන එයි.

සමහර විට යේසුස් වහන්සේ ප්‍රේත්‍රුස්ගෙන් එම ප්‍රශ්නය අසන විට ඔහු අළුතින් ආරම්භ කළ ඔහුගේ ව්‍යාපාරය, ඔහුගේ මාළු දැල් පිළිබඳව සඳහන් කලා විය හැකිය. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය ගැන සිතීමට හෝ වෙලාවක් නැති තරමට ජීවිතයේ ලෞකික වෘත්තීන් අපගෙන් කී දෙනෙකුට අවශෝෂණය වී තිබෙනවාද ? ලෞකික ජීවිතයේ ධනය, අභිලාෂයන්, සාර්ථකත්වය හා රැකියාවේ ජයග්‍රහණ ලුහුබැඳීම, පාඩුවීම්, ව්‍යසනයන් ව්‍යාපාරවල අරගල පිළිබඳ කණස්සල්ල සැලකිල්ල, බිය ආදී මෙම කාරණා මනුෂ්‍යයන්ගේ හදවත් ගැලවුම්කරුවාණන් සමඟ ඇති සහයෝගීතාවයෙන් සහ උන්වහන්සේ අපගේ ජීවිත වලින් අපගේ හදවත් වලින් ඉල්ලා සිටින අයිතියෙන් අපව ඈත් කරනු ලබයි.

සමහර අය තුළ එය සිදුකරනු ලබන්නේ පුද්ගලික මිත්‍රත්වයත්, පවුලේ සෙනෙහස, සමාජීය ජීවන රටාව වැනි බැඳීම් වන්නේය. ස්වාමීන් වහන්සේගේ උතුම් වූ කැඳවීමෙන් අපගේ හදවත් පසෙකට හරවා ගැනීමට අපගේ එදිරිවාදියා වන යක්ෂයාට අවශ්‍ය වූ විට යම් අසීමිත සෙනෙහසකින් අපව රවටා ගැනීමට, සමහර රූප චන්දනාවේ ක්‍රියාවන්, භූමික ප්‍රේමයන්ගෙන් අපව පොළඹවා ගැනීමට උත්සාහ දරයි. සාතන්ට අපව පාපයට ගෙන යාමට නොහැකි නම් පාපයට ගොදුරු කරවන සීමාවේ හෝ අපව කැරකැවීමට අවම වශයෙන් උත්සාහ දරයි. එයින් බලාපොරොත්තු වන්නේ අපගේ අවධානය වෙනතකට යොමු කරවීමටයි. නැවේ තට්ටුවේ ඇති කුඩා යකට කැබැල්ලකින් මාලිමාවේ නියම දිශාව පෙන්වීම

2 පිටුවට

1 පිටුවෙන්

නුඹ මට ප්‍රේම කරනවාද ... ?

වැළැක්වී නැවේ ගමනාන්තය වෙනස්විය හැකිය.

සමහර විට අපි ක්‍රිස්තුස් වහන්සේ අප කෙරෙහි ඇති උතුම් වූ ප්‍රේමයෙන් සහ උන්වහන්සේගේ සේවය කරුණුකොටගෙන ජීවිතයේ ප්‍රකාශවන්නා වූ පිරිසිදු කිරීම් (වැඩිදියුණු කිරීම්) සහ රසවත්භාවයේ අත්විඳිම්වලින් ඈතට ගොස් සිටින්නෙමු. දහස් ගණන් කිතුණුවන් ඉස්තරම්ම දේවලට සුඛෝපභෝගී ආශ්වාදයට, අනර්ඝ වූ නිවාසවලට, මිල අධික ගෘහ භාණ්ඩවලට, මිල අධික මෝටර් රථවලට, දෙවස්ථානයේ අනවශ්‍ය සැරසිලි සංගීත සහ ආගමික විනෝදාශ්වාදය සඳහා පවා තම මුදල් වැය කරති. වර්තමානයේ විදේශයන්හි කරන මිෂනාරි සේවාවන්වලට බාධාවක් වී තිබෙන්නේ ලෝකයේ සතුට සහ සැප සම්පත් මත යක්ෂයා වෙනතකට හරවන්නා වූ දේවලට වඩා දෙවියන් වහන්සේගේ දරුවන් වැදගත් නොවන දේවලට හැරීගොස් කරන්නා වූ නාස්තියයි. මේ දෙවල් සිදුවීම දෙවියන් වහන්සේ ලෝකයෙන් අපේක්ෂා කලත් තම ජීවිතයේ සුඛෝපභෝගී කාරණය සඳහා දහස් ගණන් වියදම් කරන තමන් වහන්සේගේ දරුවන්ගෙන් උන්වහන්සේ අසන්නේ "මේ සියල්ලට වඩා ඔබ මා ආදරේ කරනවාද" කියාය. ඇත්තටම උන්වහන්සේට අපගේ ආදරය විශ්වාස කළ හැකිද ...?

ක්‍රිස්තුස් වහන්සේට සම්පූර්ණ භක්තිය

සෑම කෙනෙකුගෙන්ම ක්‍රිස්තුස් වහන්සේ අසන අනිවාර්ය ප්‍රශ්නය නම්, ඔබ මට ආදරේ කරනවාද යන්නයි. මෙය නොමැතිව අපට ක්‍රිස්තුස් වහන්සේ උදෙසා කිසිවක් කළ නොහැකි වන අතර අවසාන දවසේදී සෝදිසි කිරීම වන්නේ එයයි. **"යමෙක් ස්වාමීන් වහන්සේට ප්‍රේම නොකරන්නේ නම් ඔහු ශාපලද්දෙක් වේවා. ස්වාමීන්වහන්සේ එන සේක."** (1 කොරින්ති 16:22) පිරිහීමේ පළමු ලක්ෂණය ප්‍රේමය නොමැතිකමයි. එපීස සභාවේ පළමු ප්‍රේමය අහිමිවී තිබූ අතර එය ප්‍රතික්ෂේප කිරීමට ආසන්න විය. ලවෝදිකයේ සභාවේ ඇල්මැරුණු ස්වභාවය ස්වාමීන් වහන්සේට පිළිකුල් සහගතව තිබුණි. අපගේ කථාව, අපගේ ක්‍රියාව, අපගේ පොරොන්දු, අපගේ වෘත්තීන් , උන්වහන්සේ කෙරෙහි ඇති සැබෑ භක්තියේ හෘදස්පන්දනය සමඟ නොපෙනෙන්නේ නම් අප්‍රසන්න සහ දැඩි පිළිකුල ඇති වන්නේය. ඔබගේ ජීවිතයේ ගැඹුරින්ම සොයන තෙක් උන්වහන්සේ ඔබව ඔබ මට ප්‍රේම කරනවාද ... ? යන මෙම ප්‍රශ්නය වෙතට යොමු කරනු ලබයි.

මේ අවසාන දවස්වලදී උන්වහන්සේ ඉල්ලා සිටින්නේ නිකම්ම අනුගාමිකයන් නොව, නමුත් උන්වහන්සේගේ අනුගාමිකයන් මෙලෙස වන පිණිසය. **"ස්ත්‍රීන්ගෙන් කිළුටු නූවූවෝ මොවුහුය. වක්නිසාද මොවුහු බ්‍රහ්මචාරීහුය. බැටළු පැටවාණන් යන යන තැනට උන්වහන්සේ අනුව යන්නෝ මොවුහුය. මොවුහු දෙවියන් වහන්සේටත්, බැටළු පැටවාණන්ටත් නැඹුල් වල වන පිණිස මනුෂ්‍යයන් අතරෙන් විලේට ගන්නා ලද්දෝය."** එළිදරව් 14.4) උන්වහන්සේගේ මිත්‍රයන්වීමට පමණක් නොව උන්වහන්සේ අණකරන ඕනෑම දෙයක් කරන මිතුරන්වීමටය. (යොහාන් 15:14) බැටළු පැටවානන්ගේ විවාහ මංගල්‍යයට සහභාගි වන අමුත්තන්වීමට පමණක් නොව අන් කිසිවෙක් සමඟ බෙදා නොගන්නා වූ සෙනෙහසකින් උන්වහන්සේගේ ප්‍රේමය බෙදා ගන්නා වූ උන්වහන්සේගේ මනාලිය වන පිණිසය.

ස්වාමීනී..., ඔබවහන්සේට සමීපවීමට වඩා අඩුවෙන් කිසිවක් මට නොලැබේවා. ඔබගේ සෙනෙහසට වඩා අඩුවෙන් කිසිවක් හෝ ඔබගේ හොඳම දෙයට වඩා අඩුවෙන් කිසිවක් මට නොලැබේවා. කියා පිළිතුරු දෙන්නේ කවුද ..? ස්වාමීනී..., මම ඔබවහන්සේට බොහෝ සේ ප්‍රේමකරන බව ඔබවහන්සේ දන්නා සේක. මම සියල්ල කැප කරමින් මෙලෙස මොරගසන්නෙමි. ඔබ දන්නවා ස්වාමීනි, මම ඔබට ආදරෙයි. මගේ මුළු හදවතම ඔබගේය. මක්නිසාද මම සදහටම ඔබගේය. ඔබ මාගේය.

ආදරය ඔප්පු කළ යුතුය.

එම නිසා ආදරය හැඟීම්වලට වඩා, විරෝධතාවලට වඩා, ශක්තිමත් උණුසුම් කථාවට වඩා වැඩි විය යුතු බව මෙම ඡේදය අපට යෝජනා කරයි. එය ප්‍රායෝගික විය යුතුය. එය ඔප්පු කළ යුත්තේ පරිත්‍යාගයෙන්, උන්වහන්සේ පණවන සෝදිසි කිරීමට කීකරුවීමෙන් සහ උන්වහන්සේ අණකරන සේවය ඉටු කිරීමෙන් වන්නේය.

ප්‍රේත්‍රැස්ගේ සෑම පිළිතුරක් අතරතුරදීම ඔහුගේ ස්වාමීන් වහන්සේගේ තොල් වලින් විශේෂ වූ වගකීමක් පරවා දෙනු ලැබූ සේක. **"මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්න", "මාගේ බැටළුවන් පාලනය කරන්න," "මාගේ බැටළුවන් පෝෂණය කරන්න."** අපගේ ස්වාමීන් වහන්සේට තිබෙන අපෙග් භක්තිය ගැන කථා කරමින් ජීවත්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. උන්වහන්සේ ගැන උද්යෝගීමත් ගීතිකා ගායනා කිරීම සහ දිදුලන කවි පවා ලිවීම පමණක් ප්‍රමාණවත් නොවේ. නමුත් උන්වහන්සේ ඉල්ලා සිටින ප්‍රේමයේ පරීක්ෂණය නම් අවශ්‍යතා ඇති (අසරණ) නැතිවී සිටින දුකිවිඳින දරුවන් වෙනුවෙන් අප කොපමණ සැලකිල්ලක් දක්වනවාද .. ? සහ ඔවුන් සොයා යාමට අපි කොපමණ උත්සහ කරනවාද යන්නයි. ඔවුන් සොයාගෙන, උන්වහන්සේ මෙන් ඔවුන්ට සේවය කරන්න. උන්වහන්සේගේ ප්‍රේමය තහවුරු කිරීමට අවශ්‍යය වූ විට උන්වහන්සේ එය ඉටු කළ සේක. ඒ ප්‍රේමය ගැන කථා කිරීම පමණක් නොව උන්වහන්සේගේ ජීවිතයම අප වෙනුවෙන් පූජා කිරීමෙන් ප්‍රේමය ඔප්පු කළ සේක. **"නුවුත් දෙවියන් වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ මරණය විඳීමෙන්ය."** (රෝම 5:8)

මෙය දෙවියන් වහන්සේ අප කෙරෙහි ඇති උන්වහන්සේගේ ප්‍රේමය පෙන්වීමේ මාර්ගය වන අතර උන්වහන්සේ අපෙන් ඊට අඩු ප්‍රේමයක් බලාපොරොත්තු නොවේ. **"මක්නිසාද දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය."** (යොහාන් 3:16) අපගේ ප්‍රේමය දැක්වීමට සහ ස්වාමීන් වහන්සේට උපරිමයෙන් එය ලබාදීමට හේතුව වන්නේ එයයි.

ප්‍රේමයේ මුල් සහ ඒවායේ පැතිරීම

රිවි කාර්මයිකල් විසිනි.

පෙරමග දූතයා සඟරාවේ මෙම කාලාපය තුළ ප්‍රේමය යන තේමාව කෙරෙහි අවධානය යොමු කර ඇත. එනම් දෙවියන් වහන්සේ අප කෙරෙහි දක්වන ප්‍රේමය හා අපි උන්වහන්සේ කෙරෙහිත් අනිත් අය කෙරෙහිත් දක්වන ප්‍රේමය වේ. අවම වශයෙන් ප්‍රධාන හේතු දෙකක් සඳහා අපගේ හදවතට ගැඹුරින් ගත යුතු තේමාවකි.

පළමුවෙන් අපගේ ජීවිත සඳහා ස්වාමීන් වහන්සේගේ කැමැත්තෙහි කේන්ද්‍රය වන්නේ ප්‍රේමයයි. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **"නුඹේ වුළු හෘදයෙන් ද, නුඹේ වුළු ආත්මයෙන්, නුඹේ වුළු බුද්ධියෙන්ද, "නුඹේ වුළු ශක්තියෙන්ද නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේට ප්‍රේම කරපන්න යන එකය. දෙවෙනි එක නම්, නුඹට මෙන් නුඹේ අසල්වැසියාට ප්‍රේම කරපන්න යනුය. මේවාට වඩා උතුම් වූ අන්කිසි ආඥාවක් නැතියි කී සේක."** (මාර්ක් 12:30-31) **"මා නුඹලට ප්‍රේම කලාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරන ලෙස එකිනෙකාට ප්‍රේමකරපල්ලාය. කියා අලුත් ආඥාවක් වම නුඹලාට දෙමි."** (යොහාන් 13:34) අපි ප්‍රේමය තුළ තව වඩා වඩා බොහෝ විය යුතුය. (පිලිප්පි 1:11) එකිනෙකා කෙරෙහි බලවත් ප්‍රේමයක් ඇතුව සිටිය යුතුය. (1 ප්‍රේත්‍රැස් 4:8) ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකළ යුතුය. (එපීස 4:15) ප්‍රේමයෙන් හැසිරෙන්න (එපීස 5:2) "නුඹලා එකිනෙකාට ප්‍රේමකරනවා නම් නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැන ගන්නවා ඇතැයි කී සේක." (යොහාන් 13:35) ප්‍රේමය නැති නම් අපි හිස් වන්නෙමු. (1 කොරින්ති 13:1-3) අපි ප්‍රේම කරන්නේ නැති නම්, අපි දෙවියන් වහන්සේව අදුණන්නේ නැත. මක්නිසාද දෙවියන් වහන්සේ ප්‍රේමයය. (1 යොහාන් 4:8)

ප්‍රේමය පිළිබඳව බැරෑරුම් ලෙස සලකා බැලිය යුතු දෙවන හේතුව වන්නේ අන්තිම කාලයේ ජීවත්වන අපට යේසුස් වහන්සේ අනතුරු ඇගවූ බැවිනි. **" අධර්මිෂ්ඨකම බෝවන බැවින් බොහෝ දෙනාගේ ප්‍රේමය හීන වන්නේය."** (මතෙව් 24:12) තමන්ටම ප්‍රේම කරන්නන්, මුදලට ප්‍රේම කරන්නන්, දෙවියන් වහන්සේට වඩා සැප සෙල්ලමට ප්‍රේමකරන්නන් සිටින බව පාවුල්තුමා පැවසුවේය. (2 තිමෝති 3:1-4) ශක්තිමත්ව සිටින ඇදහිලිවන්තයින් පවා ඔවුන්ගේ පළමු ප්‍රේමය අත්හැරිය හැකි බව මෙයට එකතු කරමින් එපීස සභාවට උන්වහන්සේ කළ දැඩි තරවටු කිරීමත් සලකා බලන්න. යහපත් ක්‍රියාවලින් යුක්ත නොපසුබට උත්සහය ඇති සැබෑ ධර්මය පවතින සභාව පවා ප්‍රවේශම් විය යුතුය. **"නුවුත් නුඹේ පළමු ප්‍රේමය අත්හැරියෙහිය යන කාරණය නුඹට විරුද්ධව මට ඇත්තේය."** (එළිදරව් 2:4)

මේ සියල්ල කල්පනාවේ තබාගෙන අපගෙන්ම ඇසිය යුතු හොඳම ප්‍රශ්නය වන්නේ අපි අපගේ ජීවිත ප්‍රේමයෙන් සලකුණු කර තිබෙනවාද යන්නයි. අපගේ මුළු හෘදයෙන්, බුද්ධියෙන්, ශක්තියෙන්, ආත්මයෙන් දෙවියන් වහන්සේට ප්‍රේමකරනවාද...? අනිත් අය වෙනුවෙන් අපගේ ජීවිත ප්‍රේමයෙන් පිරී තිබෙනවාද ... ? ක්‍රිස්තුස් වහන්සේ තුළ සහෝදර, සහෝදරියන්ට මෙන්ම අපගේ අසල්වැසියන්ටත්, අපට සතුරන්ව සිටින අය උදෙසා වුවත් අපගේ හදවත් ප්‍රේමයෙන් පිරී තිබෙනවාද ..?

ප්‍රේමය නැවත දල්වමු

ස්වාමීන් වහන්සේ සහ අනිත් අය කෙරෙහි ඔබගේ ප්‍රේමයෙහි යම් අඩුවක් ඔබට දැනෙන්නේ නම් යහපත් පණිවිඩය වන්නේ ඔබගේ ප්‍රේමය නැවත දැල්විය හැකි බවයි. යේසුස් වහන්සේ එපීසවරුන්ට ඔවුන්ගේ පළමු ප්‍රේමය අත්හැරීම ගැන තරවටු කළ නමුත් පසුතැවීමට ඔවුන්ව කැඳවීමෙන් උන්වහන්සේ ඔවුන්ට බලාපොරොත්තුවක් ගෙන දුන් සේක. **" එබැවින් නුඹ වැටී සිටින්නේ කොතැනින්දැයි සිහිකොට,**

3 පිටුවට

2 පිටුවෙන්

ප්‍රේමයේ මුල් සහ ඒවායේ...

පශ්චාත්තාපව, පළමු ක්‍රියාවන් කරපන්න. නැතහොත් මම නුඹලාට ඇවිත් නුඹ පශ්චත්තාප නොවෙනවා නම්, නුඹේ පහන් රැක ස්වකීය ස්ථානයෙන් අහක්කරන්නෙමි." (එළිදරව් 2:5) ස්වාමීන් වහන්සේට අපව ගොඩනැගීමට හැකි බව පාවුල් තුමා මත්කර දෙන්නේය. **"අප නුඹලාට ප්‍රේම කරන්නාක් මෙන්ම ස්වාමීන් වහන්සේ නුඹලාගේ එකිනෙකා කෙරෙහිත් අනික් සියල්ලන් කෙරෙහිත්, නුඹලාගේ ප්‍රේමය වැඩි කර එයින් නුඹලා පුරවා මෙසේ අපගේ ස්වාමී වූ යේසුස් වහන්සේ තමන්ගේ සියලු ශුද්ධවන්තයන් සමඟ එන කළ නුඹලාගේ සිත් අපගේ පියවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින් නිදොස්ව තිබෙන්ට ස්ථිර කරන සේක්වා."** (1 තෙසලෝනික 3:12 -13) පිලිප්පි 1:11 වන පදයත් කියවා බලන්න. අපගේ ජීවිත දෙවියන් වහන්සේගේ සේවය සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ වෙත යොමු කරන විට උන්වහන්සේ අප තුළ ප්‍රේමයේ ඵල නිපදවන සේක. (ගලාති 5:22) එමෙන්ම දෙවියන් වහන්සේගේ ප්‍රේමය අපගේ හදවත්වලට වගුරුවන සේක. (රෝම 5:5) එකිනෙකා ගැන සැලකිලිමත් වන විට ප්‍රේමයට ද යහපත් ක්‍රියාවලට ද පොළඹවනු ලබන්නෙමු. (හෙබ්‍රෙව් 10:24)

මේ සියල්ල ඔබගේ සිහියේ තබමින් ඔබගේ හදවතේ ස්වාමීන් වහන්සේ කෙරෙහි සහ අනිත් අය කෙරෙහි ඇති ප්‍රේමය තිවුර කිරීමට අපි බලාපොරොත්තු වන්නෙමු. අපෝස්තුළු පාවුල් මෙන් ස්වාමීන් වහන්සේට යාච්ඤා කරමු. **"වේ නිසා ස්වර්ගයෙහිද, පොළොවෙහිද ඒ ඒ ගෝත්‍රයට නම් දෙන්නා වූ පියාණන් වහන්සේට මම මගේ දණ නමා උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේ කරුණාකොටගෙන නුඹලාගේ අභ්‍යන්තර මනුෂ්‍යයා තුළ නුඹලා බලයෙන් ශක්තිමත් වන පිණිසත්, අදහිල්ල කරුණාකොටගෙන ක්‍රිස්තුස් වහන්සේ නුඹලාගේ සිත් තුළ වාසය කරන පිණිසත්, නුඹලා ප්‍රේමයෙහි මුල් අද පිහිටා සිට, දෙවියන් වහන්සේගේ මුළු සූර්ණකවට සූර්ණවන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන, එහි පළල, දිග, උස, ගැඹුර කිවෙක්ද කියා තේරුම්ගන්නට නුඹලාට පුළුවන් වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි."** (එපීස 3: 14-19)

අපගේ මුළු හදවතින්ම දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම

(ජෝර්ජ් ජී. වොට්සන් විසිනි.) (1845 - 1923)

පළමු සහ මහත් වූ ආඥාව නම් දෙවියන් වහන්සේට අපගේ මුළු හෘදයෙන්, බුද්ධියෙන්, ශක්තියෙන්, ආත්මයෙන් ප්‍රේම කිරීමයි. (මතෙව් 22:38, මාර්ක් 12:30) නැවත උත්පාදනය නොවී. පවිත්‍ර නොවී මුළුහදවතින්ම තම මැවුම්කරුවාණන්ට ප්‍රේම කිරීමකින් තොරව කිසිම පුද්ගලයෙකුට සැබවින්ම සාමාකාමී ප්‍රීතිමත්, ප්‍රයෝජනවත් ජීවිතයක් ගත කළ නොහැකිය. ඉහළින් පැමිණෙන යහපතට අයත් නියෝගවලට සම්පූර්ණයෙන්ම යටත්වීමට කැමති වන්නේ මනුෂ්‍යයන්ගෙන් සුළු කොටසක් පමණි.

පළමු ආඥාව හදවතින්ම පිළිපදින්නේ නම් ලෝකයට අත්දකින්නට ලැබෙන ස්වර්ගීය වෙනස්කම් මොනවාදැයි සිතන්න. මේ ගැන සිතීම තුළින් දෙවියන් වහන්සේ කවුද .. ? උන්වහන්සේගේ වචනය කුමක්ද ..? උන්වහන්සේගේ ප්‍රේමය කෙබඳුද .. ? යන්න දැන ගැනීමට අපට උපකාර කරයි. **"නුඹේ දෙවි වූ ස්වාමීන් වහන්සේට නුඹේ මුළු සිතෙන්ද, නුඹේ මුළු ආත්මයෙන්ද, නුඹේ මුළු ශක්තියෙන්ද ප්‍රේමකරපන්න."** (ද්විතිය කථාව 6:5) යන මෙම කෙටි ආඥාව මේ කුරිරු ලෝකය සැබෑ පාරාදීසයක් බවට පත්කිරීමට ප්‍රමාණවත්ව තිබේ. අපගේ ආත්මය පාපයෙන් පිරිහී නොතිබුණේ නම් දෙවියන් වහන්සේට ප්‍රේම කරන ලෙස අපට ආඥා කිරීමට සිදු නොවනු ඇත. පාපය බැහැර කර අපගේ දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම ප්‍රීතිමත් වරප්‍රසාදයක් ලෙස අපි දකිමු. නීතියක් පැණවීමට සිදුවී ඇත්තේ පාපය නිසාය. දෙවියන් වහන්සේගේ ප්‍රේමය පිළිබඳව අප නිසි ලෙස දැනුවත් වූ විට මුළු හදවතින්ම ප්‍රේම කරමින් මැවිල්ල තුළ ඇති මිහිරි ප්‍රීතිය අත්විඳින්නෙමු. දෙවියන් වහන්සේ කවුද ? උන්වහන්සේ අපට කර තිබෙන්නේ කුමක්ද ..? කියා ප්‍රමාණවත් ලෙස දැන සිටියේ නම් අපි දණින් වැටී උන්වහන්සේට ප්‍රේම කිරීමට අවශ්‍ය සියලු වරප්‍රසාද ඉල්ලා සිටින්නෙමු.

ස්වල්ප දෙනෙක් පමණක් දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමට හේතුව වන්නේ උන්වහන්සේට ප්‍රේම කිරීමට තරම් ප්‍රේමයක් ස්වභාවයෙන්ම ඔවුන් තුළ නොමැතිවීමයි. දෙවියන් වහන්සේට සැබවින්ම ප්‍රේම කළ හැකි වන්නේ උන්වහන්සේගේම ප්‍රේමයෙන්ම පමණි. දෙවියන් වහන්සේට සැබවින්ම සහ ශුද්ධ ලියවිලිවල ප්‍රකාරයට ප්‍රේම කිරීමට පෙර ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය මගින් අපගේ හදවත් තුළට දිව්‍ය ප්‍රේමය බෙදාහැරිය යුතුය.

ග්‍රීක භාෂාවෙන් ලියන ලද අළුත් ගිවිසුමේ මුල් පිටපත් තුළ ප්‍රේමය සඳහා වචන දෙකක් භාවිතා වේ. එක් වචනයක් නම් **"පිලෝස්"** වේ. එයින් අදහස් කරන්නේ, සියලු මනුෂ්‍යයන්ට ඇති ඕනෑම ස්වභාවයක මිනිස් ආදරයකි. අනිත් වචනය නම් **"අගාපේ"** යනුය. එයින් අදහස් කරනු ලබන්නේ දිව්‍යමය ප්‍රේමයයි. එයින් දෙවියන් වහන්සේගේ හැඟීම් සහ චරිතය සංකේතවත් කරයි. අපගේ ස්වභාවික උපතින් අපට මිනිස් සෙනෙහස ලැබෙනවා සේම දේවරාජ්‍යය තුළ අපගේ ආත්මික උපත ලැබීම මගින් දිව්‍යමය ආදරය ලබා ගනිමු. දිව්‍යමය ප්‍රේමය අපට ලබාදීමෙන් පසුව පවා මෙම දිව්‍යමය ප්‍රේමයට පරිපූර්ණ නිදහසක් ලැබීමට පවිත්‍රවීම සහ ශුද්ධාත්ම ගින්නෙන් භෞතිස්මවීම අවශ්‍ය වේ. ප්‍රේමයේ අදියර හතක් පහතින් දැක්වෙන අතර අපගේ ආශිර්වාද ලත් මැවුම්කරු සහ මිදුම්කරු වෙත උන්වහන්සේගේ ප්‍රේමය සඳහා අපට නැවත හැරීයාමට හැකිය.

(1) කෘතවේදී ආදරය

කෘතවේදීත්වයේ ආදරය යනු අළුතින් පරිවර්තනය වූ හදවත තුළ පැන නගින දිව්‍ය ප්‍රේමයේ පළමු ආකාරයයි. කෘතවේදීත්වයේ ප්‍රේමය තුළ ස්තුතිදීම පිරී පවතින්නේය. යේසුස් වහන්සේ ප්‍රකාශ කළ එම කෘතඥතාවයේ මිහිර මෙම පදයෙන් ප්‍රකාශ වේ. **"ඒ ප්‍රස්තාවේදී යේසුස් වහන්සේ උත්තර දෙවින්කියන සේක්, ස්වර්ගයටත් , පොළොවටත් ස්වාමී වූ පියාණනි, ඩබවහන්සේ ප්‍රඥාවන්තයන්ගෙන්ද, තේරුම් ඇත්න්ගෙන්ද මේ කාරණා සඟවා ළදරුවන්ට එළිදරව් කළ බැවින් ඩබට ස්තුති කරමි."** (මතෙව් 11:25) රතු මුහුදෙන් එතර වූ පසු දෙවියන් වහන්සේ ජයග්‍රහණය කළ බවත්, සතුරා මුහුදට හෙළා ඇති බවත්, මිරියම් රබානක් ගෙන ගායනා කළ ඇගේ ප්‍රීතිමත් ගීතයට කෘතඥතාවය එකතු කර ඇත. **"එවිට ආරොන්ගේ සහෝදරිවූ මිරියම් ප්‍රොපේත වූ තොමෝ රබානක් අතින් ගත්තීය. සියලු ස්ත්‍රීහු රබන්ද, නැටුම්ද ඇතිව ඈ පස්සේ ගියෝය. මිරියම් ඩවුන්ට උත්තර දෙමින්, ස්වාමීන් වහන්සේට ගායනා කරව්. මක්නිසාද උන්වහන්සේ තේජාන්විත ලෙස ජයගත් සේක. උන්වහන්සේ අශ්වයා සහ අසුරුවා මුහුදට හෙළු සේකැයි කීවාය."** (නික්මයාම 15:20-21) කුඩා සාමුවෙල්ව කැපකිරීමේදී හන්නා කෘතඥතාවය ප්‍රකාශ කරමින් ගායනා කළේය. **"අධිපතීන් සමඟ හිඳුවන පිණිසත් මහිමයේ සිංහාසනය උරුමකරවන පිණිසත් උන්වහන්සේ දුප්පතා ධූලියෙන් නැඟිටුවනු සේක. දිළින්දා කසල ගොඩින් ඩසවන සේක. මක්නිසාද පොළොවේ කණු ස්වාමීන් වහන්සේගේය. උන්වහ්නසේ ලෝකය ඒවා පිට පිහිටෙවූ සේක."** (1 සාමුවෙල් 2:8)

කෘතඥතාවයේ ආදරය අතීතයේ දී දෙවියන් වහන්සේගේ දයාව ගණන් කිරීමට සතුටු වන අතර ඒවා ප්‍රියමනාප මතකයට හරවනු ලබයි. මරියාද කෘතඥතාවයේ ආදරය දැක්වීය. **"නුමුත් මරියා ඒ සියලු කීවි සිතේ තබාගෙන මෙනෙහි කළාය."** (ලූක් 2:19) කෘතඥතාවයේ ආදරය අන් අය සැහැල්ලුවෙන් සිතන දේවල් තම හදවතින් මෙනෙහි කරනු ලබයි. අන් අය කුඩා ආශිර්වාද, සුළු දයාව, යාච්ඤාවට නොවැදගත් පිළිතුරු ලෙස හඳුන්වන දේ අගය කරයි. කෘතවේදී ආදරය තවමත් ආදරයේ ඇස්වලින් බැලීමට ඉගෙනගෙන නැති අයගේ අවධානයට ලක්නොවන දහසක් කුඩා දේවල් තුළ දෙවියන් වහන්සේගේ විශාලත්වය දකියි.

මෙම ආදරය ඉතා යටහත් සහ පසුතැවිලිවීමේ ආත්මයෙන් පූර්ණව නිහතමානීවන අතර මෙතරම් දිව්‍යමය යහපත්කමක් ලැබීමට සුදුසුකමක් නැති බව හැඟේ'. එහි සියලු ආශිර්වාද මනිනු ලබන්නේ ඔවුන්ට ලබාදෙන හස්තයේ අනර්ඝත්වයෙනි. කෘතවේදී ආදරය සදාකාලිකවම දෙවියන් වහන්සේ වෙතට ස්තුතිදීමේ සුවඳ දුම් ගෙන යන අතර දිනකට බොහෝ වාර ගනණක් **"ස්තුතියි..., පියාණෙනි "**කියා පවසනු ඇත.

(2) තෝරාගත හැකි ආදරය

දෙවියන් වහන්සේව තෝරා ගැනීමේ ආදරය කරුණාකොටගෙන මැවිල්ලේ සිටින්නා වූ අනෙක් සියලුම ජීවීන් සමඟ සන්සන්දනය කර දෙවියන් වහන්සේ ඒ සියල්ලට වඩා උසස් බව දැකගත හැකිය. උන්වහන්සේගේ ක්‍රියාමාර්ගවලදී උන්වහන්සේගේ විශිෂ්ඨත්වය, උන්වහන්සේගේ ආධිපත්‍යය, රැකවරණය, අනුකම්පාව, දයාව ,අනිත් සියල්ලන්ට වඩා ඉහළින් පවතින බවත් අපි දනිමු. ලෝකයේ යහපත් යැයි පෙනෙන සෑම දෙයකම ඇති පහවයන බව, හිස් බව, වංචාව සහිත බව පෙන්වා දෙන්නේ මෙම ප්‍රේමණීය දෙවියන් වහන්සේගේ ස්වරූපයයි.

දේවදූතයන්, සාන්තුවරයන් සහ අපගේ පොදු සෙසු ජීවීන් සමඟ සන්සන්දනය කිරීම කරුණාකොටගෙන දෙවියන් වහන්සේව තෝරාග න්නේ මෙම ප්‍රේමයයි. අපි මැටි ගුලියකට වඩා දියමන්තියක් තෝරාගෙන වැඩි වැඩියෙන් ප්‍රීතිවෙන්නාක් මෙන් අන් සියල්ලට වඩා දෙවියන් වහන්සේව තෝරා ගනිමු. තෝරාගැනීමේ ආදරය තුළ දෙවියන් වහන්සේගේ ස්ථානය ගැනීමට අනවසරයෙන් ඇතුල්වන හෝ අවම වශයෙන් අපගේ හදවත් තුළ බෙදා ගැනීමට උතසාහ දරණ සියල්ල ප්‍රතික්ෂේප කරන්නේ මෙම තෝරාගැනීමේ ප්‍රේමයයි. අනෙකුත් සියලුම ව්‍යාජ දෙවිවරුන්, සියළුම බොරු අනාගතවකතෘවරුන්, සියලුම ව්‍යාජ ආගම් ප්‍රතික්ෂේප කරන්නේ මෙම ප්‍රේමයයි. දෙවියන් වහන්සේගේ ස්ථානය ගැනීමට හෝ අඩුතරමින් දෙවියන් වහන්සේට ලැබිය යුතු ගෞරවය, ප්‍රශංසාව ගැනීමට උත්සාහ කරන ඕනෑම දෙයකට එරෙහිව අපගේ හදවත්

4 පිටුවට

3 පිටුවෙන්

අපගේ මුළු හදවතින්...

දැවෙන්නේ මෙම තෝරාගැනීමේ ප්‍රේමය නිසාය.

මෙම තෝරා ගැනීමේ ප්‍රේමය ගැන ප්‍රේතුස් සඳහන් කරනවිට ඔහු අපට පවසා ඇත්තේ මෙසේය. **"නුඔත් නුඹලාගේ සිත් වලින් සවාමීන් වහ්සේ කොට ක්‍රිස්තුස් වහන්සේට ගෞරව කbපල්ලා, නුඹලා තුළ ඇත්තා වූ බලාපොරොත්තුව ගැන නුඹලාගෙන් අසන සියල්ලන්ට උත්තb දෙන්ට නිතb සැදී සිටපල්ලා. නමුත් මෘදුකමින්ද, යටහත්කමින්ද එසේ කළ යුතුය."** (1 ප්‍රේතුස් 3:4-5) සියලුම කාරණාවලදී අපගේ හදවත්වල දෙවියන් වහන්සේට නිවැරදි ස්ථානය ලබාදිය යුතුය. අපගේ සෑම රූප නමස්කාරයක්ම බිඳ දමා, සෑම බන්ධනයක්ම කඩාදමා, ඔනෑම ලුහුබැඳියාමකින් හැරී ඕනෑම මිත්‍රත්වයක් බිඳ දමා, ඕනෑම භූමික ගෞරවයක් හෝ දෙවියන් වහන්සේගේ ප්‍රකාශයන්ට සහ අපගේ ප්‍රේම කිරීමට කීකරුවීමට බාධා කරන ඕනෑම අභිලාෂයක් ප්‍රතික්ෂේප කිරීමට උපකාරී වන්නේ මෙම තෝරාගැනීමේ ප්‍රේමයයි. තෝරාගත් ප්‍රේමය කරුණුකොටගෙන දෙවියන් වහන්සේගේ පරමාධිපත්‍යය ගැන ප්‍රශංසා කරන අතර උන්වහන්සේගේ මහිමය සමග තරඟවැදීමට උත්සාහ කරන සියල්ල පැත්තකට දමමු. එය සියල්ලන්ගේම ස්වාමියා වන ක්‍රිස්තුස් වහන්සේට ඔටුණු පැළඳවීමයි. පොළොවේ දේවල් වලින් ආත්මික දේවල් වෙන්වීම මේ ආදාරයේ (ප්‍රේමයේ) විශේෂ ඵලයයි.

(3) තෘප්තිමත් ආදරය (ප්‍රේමය)

දෙවියන් වහන්සේ කෙරෙහි පූර්ණ තෘප්තියකින් සහ උන්වහන්සේගේ සියලු ආශිර්වාදවල පූර්ණත්වය ගැන සතුටුවේ. එය සමාදානය සහිතව තිබේ. ගීතිකාකරුවා පවසන්නේ මෙම ආදරයයි. **"ස්වර්ගයෙහි ඔබ හැb මට ඇත්තේ කවුද ..? පොළොවෙහිද ඔබ හැb මා ආශා කbන කිසිවෙක් නැත."** (ගීතාවලිය 73:25) දිව්‍යමය මනමාලයා ගැන පවසන විට සාලමොන් පවසන්නේ කුමක්ද ? **" මාගේ ප්‍රේමවන්තයා සුදුය. bතු කව්මුල් ඇත්තේය. දසදහසක් අතරේ උතුම්ය. "** (සාලමොන්ගේ ගීතිකා 5:10) ඔහුගේ මුඛය ඉතා මිහිරිය. එසේය, ඔහු මුළුමනින්ම ප්‍රියකරුය. යෙරුසලමේ දූවරුනි, මාගේ ප්‍රේමවන්තයා මේ ආකාරය. මාගේ මිත්‍රයා මෙබන්දෙක්ය. (සාලමොන්ගේ ගීතිකා 5:16) තෘප්තිමත්වීමේ ප්‍රේමයෙන් දෙවියන් වහන්සේට ප්‍රේම කරමු. මක්නිසාද උන්වහන්සේ දෙවියන් වහන්සේය. උන්වහන්සේගේ ස්වභාවයේ සදාකාලික අලංකාරය උන්වහන්සේගේ චරිතයේ මිහිරියාව, උන්වහන්සේගේ ගුණාංගවල විස්තර කළ නොහැකි ශ්‍රේෂ්ඨත්ව, උන්වහන්සේගේ මුළු පරිපූර්ණත්වයේ චමත්කාරය වටහාගෙන සිටින්නෙමු.

ශුද්ධාත්මයාණන් වහන්සේගේ වාසය කිරීම කරුණුකොටගෙන ආත්මය ගැඹුරින් විශුද්ධකර, අලෝකමත් කරන තෙක් උන්වහන්සේගේ අසීමිත ආකරය සඳහා දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමේ මෙම ස්වරූපයට ඇතුල්වන්නේ කලාතුරකිනි. පවිත්‍ර සිත් ඇත්තෝ භාග්‍යයවන්තයෝය. මක්නිසාද මේ ජීවිතයේ ඇදහිල්ල තුළත් ඔවුන් දෙවියන් වහන්සේගේ පුද්ගලිකත්වය, චරිතය දකින්නෝය. තෝරා ගැනීමේ ප්‍රේමය දෙස බැලීමේ දී දෙවියන් වහන්සේ සමඟ අනිත් සියලු ජීවීන් සසඳා දෙවියන් වහන්සේගේ උත්කෘෂ්ඨ බව දැකිය හැකිය. අනිත් අතට තෘප්තිමත්වීමේ ප්‍රේමය තුළ දෙවියන් වහන්සේ කොයිතරම් මිහිරට සිටිනවාද, උන්වහන්සේගේ පරිපූර්ණත්වය කොයිතරම් තෘප්තිමත්ද, එය වෙනත් දේවල් සහ මනුෂ්‍යයන් අමතක කරන බව පෙනෙන්නට ඇත. දෙවියන් වහන්සෙගේ පාරිශුද්ධභාවය සහ උන්වහන්සේගේ පැමිණ සිටීම අනිත් කිසි දෙයක් නොපෙනන ලෙස මුළු ක්ෂිතජයම පිරී යයි.

තෘප්තිමත්කමේ ප්‍රේමය දෙවියන් වහන්සේ යනු උන්වහන්සේ පමණක් බවත්, උන්වහන්සේ කිසිදා වෙනස් නොවන බවත් වටහා ගැනීමේ ප්‍රීතියයි. සදාකාලයටම වෙන කිසිදු දෙවිකෙනෙක් නොවන බැවින් එම ප්‍රීතිය උද්යෝගිතමත්ව තිබේ. සදාකාලික අනාගතය දෙස බලන විට වෙනස්වීමේ ඡායාවක්වත් දෙවියන් වහන්සේගේ සර්වබලධාරී චරිතය මගින් ගමන් නොකරනු ඇත. දැන් අපට සිටින දෙවියන් වහන්සේ නිමක් නැති කාල වලත් එලෙසින්ම සිටින සේක. තෘප්තමත්කමේ ආදරය දෙවියන් වහන්සේගේ සියලු ගුණාංග වලින් රහසිගත සතුටක් ලබාගන්නා අතර උන්වහන්සේ කාරණා ඉටුකරන ආකාරය අගය කරයි. එමෙන්ම දෙවියන් වහන්සේගේ චරිතය මත වචනයෙන් කිව නොහැකි සමාදානය පිළිබඳ විශ්වාසය තබයි.

(4) ආශාවේ ප්‍රේමය

මෙම ප්‍රේමයේ ස්වරූපය නිසා අපි පිපාසයෙන් හා බොහෝ සෙයින් දෙවියන් වහන්සේට ආශා කරන්නෙමු. මෙම ප්‍රේමය දාවිත්ට හැගුණු විට ඔහු මෙලෙස පැවසීය. **"ස්වාමීන්ගෙන් එක් දෙයක් ඉල්ලීමි. ඒක සොයන්නෙමි. එනම් ස්වාමීන්ගේ අලංකාරය දකින පිණිසත් ඔහුගේ ජීවිතයේ සියලු දවස්වලදී ස්වාමීන්ගේ ගෘහයෙහි වාසය කිරීමය."** (ගීතාවලිය 27:4) නැවතත් ඔහු එය පවසා තිබෙන්නේ මෙසේය. **"දෙවියන් වහන්ස ....., ඔුවා දිය දොළුවලට ඉතා ආශාවන්නාක් මෙන් මාගේ ආත්මය ඔබ කෙරෙහි ඉතා ආශා ඇත්තේය. "** (ගීතාවලිය 42:1)

ආත්මික පිපාසයේ වර්ග හෝ මට්ටම් තුනක් තිබෙ. පළමුවැන්න සමාව ලබා ගැනීම සඳහාය. දෙවැන්න පාරිශුද්ධත්වය සඳහාය. තුන්වෙනුව, ජීවමාන දෙවියන් වහන්සේගේ පූර්ණත්වය ලබා ගැනීම සඳහාය. දෙවියන් වහන්සේට නිසි ලෙස ආශා කිරීමට හදවතින් උන්වහන්සේව අගේ කිරීමටත්, උන්වහන්සේ සමඟ සුහද ඇසුරක් ඇතිකර ගැනීමටත් උන්වහන්සේගේ චරිතයේ ගති ලක්ෂණ භුක්ති විඳීමටත් හැකි තත්ත්වයක තිබිය යුතුය. දානියෙල්ට මෙම ආශාව උසස් (විශිෂ්ඨ) මට්ටමක තිබුණි. දානියෙල්ට දේවදූතයා බොහෝ ප්‍රේමලත් මනුෂ්‍යයෙක් ලෙස පවසන විට එයින් අදහස් කරන්නේ ඔහු ආශාවේ ප්‍රේමය ඇතිව සිටි මනුෂ්‍යයකු බවයි. **"නුඹේ කන්නලව්වේ පටන් ගැන්වේදී ආඥාවක් ලැබ වම නුඹට දන්වන්ට ආවෙමි. වක්නිසාද නුඹ බොහෝ ප්‍රේම ලද්දෙක්ය. ඒ නිසා කාරණය කල්පනාකොට දර්ශනය තේරුවි ගනින්න."** (දානියෙල් 9:23) එනම් ඔහු දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි ආශාවකින් සිටි කෙනෙකි. දෙවියන් වහන්සේ කෙරෙහි දැඩි ආශාවකින් තොරව සිටින කිසිවෙකුට සැබෑ කිතණුවෙක් විය නොහැකිය. නුමුත් මෙම ආශාවේ විවිධ වූ ස්වරූපයන් සහ මට්ටම් තිබේ.

දෙවියන් වහන්සේ කෙරෙහි ආශාවීමේ ප්‍රේමය තුළ පවතින ස්වභාවයන් තුන දැන ගැනීමටත්, දිව්‍යමය ස්වභාවයේ එකින් එක ගුණාංගයන්ගෙන් සහ පරිපූර්ණත්වයෙන් පිරීමට ආත්මය ඇදගැනීම ආශාවීමේ ප්‍රේමයයි. ජීවමාන දෙවියන් වහන්සේට හැර වෙන කිසිවකට කිසිදු මැවිල්ලකට අපගේ සදාකාලික ආත්මය තෘප්තිමත් කළ නොහැකිය. එම නිසා දෙවියන් වහන්සේ මෙම මිහිරි උවමනාවට අපව ඇද දමනු ලබයි. එනම් රහසිගත යාච්ඤාවට දෙවියන් වහන්සේව අධ්‍යයනය කිරීමට, උන්වහන්සේගේ මුහුණේ ආලෝකය සහ ආත්මයේ ස්වභාවය දිනා ගැනීම සඳහා අනිත් දේවල් සුළුපටු ලෙස නොසලකා අපව යොමු කරවයි. දෙවියන් වහන්සේ කෙරෙහි ඇති මෙම ආශාවේ ප්‍රේමය තුළ තිබෙන තියුණු බව සාමාන්‍ය ආගමිකත්වයෙන් අපගේ හදවත් ඉවතට ගෙන කරුණාවේ කඳු මුදුන් මත විවේක ගැනීමට සැබෑ ශුද්ධකමේ කඳු මුදුන් තරණය කිරීමට අපව පොළඹවයි. එහිදී දවස මුළුලේලේම මිහිරි වූ ආලෝකය නොකඩවා රැදී තිබෙන්නේය.

දෙවියන් වහන්සේගේ මුළු අලංකාරය සඳහා වූ මෙම දැඩි ආශාව සමහර අයගේ හදවත්වල සෙමෙන්, සමහර අයගේ හදවත්වල වේගයෙන් ග්‍රහණය කරගෙන තිබෙන නමුත් ස්ථාවරව හා නිසැකව ඇදගන්නා ආකාරයට අපට මැවිල්ල දෙස බැලීමට හැකි නම් එය කොයිතරම් සුන්දර දසුනක්ද ..? එය ගොඩබිම සහ මුහුද හරහා කඳු සහ මිටියාවත් මතින්, හුදකලා සහ කටු සහිත මාර්ග හරහා දහසක් දුෂ්කරතා හරහා ඔවුන් දෙවියන් වහන්සේගේ මහිමයෙන් යුතුව ප්‍රීතියෙන් විවේක ගන්නාවූ අලංකාර දවස දෙසට ඇදී යයි. දෙවියන් වහන්සේ හැර අනිත් සියල්ල ඉක්මනින් හෝ පසුව අපව වෙහෙසට පත්කරයි. උන්වහන්සේ පමණක් සදහටම නැවුම්ව සිටින සේක. ආදරණීය හදවත්වලට උන්වහන්සේ සැම විටම නව සොයා ගැනීමක් මෙන්ය.

(5) අනුකම්පා සහගත ආදරය

මේ ආදරය කරුණුකොටගෙන දෙවියන් වහන්සේ ගැන අපට හැගීමක් දක්වනු ලබන අතර උන්වහන්සේ කෙරෙහි ඇළුම්වීමට උපකාර වන්නෙත්, උන්වහන්සේගේ ගෞරවය සහ මහිමය ගැන දැඩි ලෙස ඊර්ෂ්‍යායා වන්නේත් මේ නිසාය. අනුකම්පාව සඳහා භාවිතා කර ඇති ග්‍රීක් වචනයේ තේරුම **"දුක්විඳීම"** වේ. තවත් කෙනෙකුට සිදු වූ තුවාල, වැරදි, අවබෝධවීම සඳහා හවුල්කාරිත්මය ලබා ගැනීමයි. දුෂ්ඨ මනුෂ්‍යයන්ට සහ ශුද්ධාත්ම දෙවියන් වහන්සේට විරුද්ධව කරන දැඩි අපහාස නින්දා දැනෙන්නේ මෙම ප්‍රේමයේදීය. මෙවැනි ප්‍රේමයක් දාවිත්ගේ හදවතේ ගින්දර මෙන් ඇවිලීයද්දී ඔහු මෙලෙස කීවේය. **"ස්වාමීනී ඔබට වෛර වෙන්නන්ට වම වෛර නොකbවිද ...? ඔබට විරුද්ධව නැගිටින්නන් සඳහා වම කල නොකිෙවිද ... ? සම්පූර්ණ වෛරයකින් ඔවුන්ට වෛර කbවි. ඔවුන් මාගේ සතුරන්කොට ගනිමි. දෙවියන් වහන්ස, මා විමසා බලා මාගේ සිත දැනගත මැනව, මා පරීක්ෂාකොට මාගේ සිතුවිලි දැනගත මැනව. යම් නපුbz මාර්ගයක් මා තුලේ ඇද්දැයි බලා සදාකාල මාර්ගයෙහි මා ගෙන ගිය මැනව."** (ගීතාවලිය 139:21-24)

දෙවියන් වහන්සේගේ නාමය නිශ්ඵල ලෙස භාවිතා කරනවා ඇසීම උන්වහන්සේගේ වචනය ප්‍රතික්ෂේප කිරීම හෝ සුළු කිරීම, ස්වාමීන් වහන්සේගේ දවස පිරිහීමට ලක්වෙනවා දැකීම යේසුස් වහන්සේගේ ආශිර්වාදලත් චරිතය, විවේචනය කිරීම හෝ නිග්‍රහයට ලක් කිරීම මෙම ප්‍රේමයට දරාගත නොහැකිය. දෙවියන් වහන්සේගේ මැවිල්ල දෙවියන් වහන්සේව නොසලකා හරිමින්, ආදරය නොලබන, ස්තුතිවන්ත නොවන, විශ්වාස නොකරන සහ අගය නොකරන ආකාරය ගැන හඬා වැලපෙන ස්වභාවය මෙම ප්‍රේමයට දැනෙන්නේය. දේශයේ හෝ සභාවේ දුෂ්ඨකම්වලට ගිගුරුම් දෙමින්, තම ජීවිතය අනතුරේ හෙළන විට ප්‍රතිසංස්කරණය ඇති කරන්නන්ගේ හදවතේ ගිනි උඳුනක් මෙන් දැවෙන ප්‍රේමය මෙයයි. ඔවුන්ගේ ප්‍රේමණීය දෙවියන් වහන්සේට අපහාස කිරීම සහ හෙළා දැකීම අත්විඳිනවාට වඩා තමාගේ ජීවිතය අහිමිවීම දරා ගැනීමට අනුකම්පා සහගත ප්‍රේමය ඇති අය කැමති වන්නෝය.

සැම තැනම දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටුවනු දැකීම සෑම දෙයකදීම උන්වහන්සේගේ ගෞරවය කෙරෙහි දැඩි සංවේදීතාවයක් මෙම ප්‍රේමය තුළ පවතියි.

බොරු ක්‍රිස්තුස්වරුන්, බොරු අනාගතවකතෘවරුන් දරාගත නොහැකි දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ඇති අලංකාර, උණුසුම් ඊර්ෂ්‍යාව

5 පිටුවට

4 පිටුවෙන්

අපගේ මුළු හදවතින්...

මෙම ප්‍රේමය තුළ පවතී. මෙම දිව්‍යමය අනුකම්පාවේ ප්‍රේමය ඉතා කඩිනමින් සහ පුළුල්ව අවදිවන අතර අන් අයට හානියක් නොපෙනෙන ව්‍යාජ ධර්මයන් හා දැඩි ද්‍රෝහිකම් හඳුනාගනු ලබන්නේය. ඇදහිල්ලේ වීරයන් සහ වේදසාක්ෂිකාරයන් දෙවියන් වහන්සේට දක්වන්නේ මෙවැනි ප්‍රේමයකි. එම ප්‍රේමය සෑම විටම පාපය ගැන සහ දෙවියන් වහන්සේට ප්‍රමාණවත් ලෙස ප්‍රේමය නොදැක්වීම ගැන කණගාටු (පසුතැවිලි) වන්නෝය.

දෙවියන් වහන්සේ උදෙසා ත්‍යාගශීලී ප්‍රේමය

මෙය අධිකව තිබෙන ප්‍රේමය පිටාර ගැලීමයි. මුළු ආත්මයෙන්ම ප්‍රාර්ථනාකරනු ලබන්නේ සියලු මහිමය , ප්‍රශංසාව දෙවියන් වහන්සේට ලැබේවා කියායය. එය වෙන යම් ආකාරයකින් හෝ දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ආශිර්වාදයක් සහ ප්‍රතිලාභයක් වනු ඇතැයි ප්‍රාර්ථනා කරන්නෝය. එය දෙවියන් වහන්සේගේ ආශිර්වාද වලට සුභපතන අතර හැකි නම් එවා තවත් වැඩිකර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරනු ලබයි.

දෙවියන් වහන්සේගේ තේජස දෙආකාරයකින් පවතින බව අපි මතක තබාගත යුතුය. පළමුව දිව්‍යමය ස්වභාවය තුළ උන්වහන්සේට ආවේණික වූ මහිමය සහ දෙවනුව මැවීම තුළ ඇති භාහිර මහිමයයි. දිව්‍යමය ස්වභාවය තුළ පවතින මහිමයේ සමන්විත වන්නේ උන්වහන්සේගේ ස්වභාවික පරිපූර්ණත්වයන්, සදාකාලිකත්වය, ශුද්ධකම ත්‍රිත්වයේ සහයෝගීතාවය සහ උන්වහන්සේ තුළම ඇති අසීමිත ප්‍රීතියයි. දෙවියන් වහන්සේගේ භාහිර තේජස සමන්විත වන්නේ මැවූ ලෝකවල විශාලත්වය, විවිධත්වය, තේජස, විවිධ තරාතිරම්වල දේවදූතයන්, මනුෂ්‍යයන් සහ ජීවීන් තුළ වේ.

මෙයට එකතු වී ඇත්තේ පාපයට වැටුණු මනුෂ්‍යායව මුදා ගැනීමෙන්, කරුණාව දැක්වීමෙන්, රැකවරණය ලබාදීමේ විපාක සහ දඬුවම් ලබාදීමෙන් උන්වහන්සේගේ දයාව සහ යුක්තිය තම මැවිලිවලට යෙදීමෙන් ලැබෙන මහිමය සහ උන්වහන්සේගේ මැවිල්ලෙන් නැවත උන්වහන්සේට පිරිනමනු ලබන ප්‍රශංසාව, ආදරය, නමස්කාරය කරුණුකොටගෙන ලැබෙන මහිමයයි. දෙවියන් වහන්සේගේ ස්වභාවය තුළ නිතැතින්ම පවතින මහිමය කිසිදාක වැඩි කළ නොහැකිය. නමුත් උන්වහන්සේගේ කරුණාව සහ සත්‍යය උන්වහන්සේගේ මැවිල්ලට යෙදවීමෙන් උන්වහන්සේගේ භාහිර තේජස පුළුල් වෙමින් දීප්තිය වැඩි විය හැකිය. දෙවියන් වහන්සේ කෙරෙහි මනුෂ්‍යයාගේ කාරුණික ආදරය පැතිරෙන ක්ෂේත්‍රය මෙය වන අතර මැවිල්ලෙන් දෙවියන් වහන්සේට ප්‍රශංසාව සහ මහිමය ලබාදෙන විශාල අස්වැන්නක් නෙළා ගැනීමට සෑම විටම අවශ්‍ය වේ.

දැඩි භක්තියේ ආදරය

මෙම ප්‍රේමය තුළ පවතින්නේ ලැදියාවෙන් සතුටුවීම දැඩි භක්තියෙන්, සැකය තුළ මුලා නොවී ප්‍රේමකරන සහ ප්‍රශංසා කිරීමේ ස්වභාවයයි. මෙවැනි ප්‍රේමයක් තුළ දෙවියන් වහන්සේ ගැන පාරිශුද්ධ බියකින් සහ විරුද්ධවාදී නොවන ගැඹුරු අගයකින් මෙනෙහි කරනු ලබයි. එය නතර වී වෙනම දෙවියන් වහන්සේගේ ගුණාංග සෙවීමට යොමුවන්නේ නැතිව දෙවියන් වහන්සේව සතුටු කිරීමේ කාර්යය මෙනෙහි කරයි. නමුත් දෙවියන් වහන්සේගේ සියලු පරිපූර්ණත්වයන් ඒකාබද්ධව පළුද්දක් නැති එක් සුදු සාගරයක් මෙන් පැහැදිලි තේජස සහ මහිමය දකින්නෝය. දැඩි භක්තිවන්තකමේ ප්‍රේමය අනිත් සියලු ආකාරයේ ප්‍රේමයන්ගේ උච්චස්ථානයයි.

දෙවියන් වහන්සේට නමස්කාර කිරීම යාච්ඤාවට හෝ දේවධර්මයට හෝ ව්‍යවස්ථාවට හෝ වගකීම්වලට හෝ සේවයට හෝ ඇදහිල්ලට වඩා වැඩි දෙයකි. එය දෙවියන් වහන්සේ තුළ ඇති උත්තරීතර සතුටකි. ප්‍රේමකිරීමට ඇළුම් වන විට ආත්මය උන්වහන්සේගේ ආලෝකයෙන් බබළයි. උන්වහන්සේගේ අනුග්‍රහය තුළ සිනාසෙයි. උන්වහන්සේගේ මහිමයට මිහිරි ලෙස වෙව්ලයි. උන්වහන්සේගේ අලංකාරයට තදින් ඇළුම්වී උන්වහන්සේගේ මිහිරිබව පානය කරනු ලබයි. උන්වහන්සේට ප්‍රශංසා කිරීම සඳහා ප්‍රමාණවත් වචන කිසිවක් සොයා නොගනියි. නමුත් බැලීමට හා පුදුමවීමට තදින් හුස්ම රඳවාගෙන අගේ කරයි. උන්වහන්සේට වඩ වඩා ආදරය කිරීමට දස දහසක් හදවත් ප්‍රාර්ථනා කළ යුතුය.

මේවා දේදුන්නේ ඇති වර්ණ හත මෙන් ප්‍රේමයේ ස්වභාවයන් හතකි. ඒවා අපගේ ආදරණීය ගැලවුම්කරුවාණන්ගේ ගෙලෙහි එල්ලා තිබෙන සෙනෙහසේ වර්ණ මෙන් වේ. උන්වහන්සේ තුළ සහ උන්වහන්සේ තුළින් අපගේම ස්වාමීන් වන අපගේ ආදරණීය පියාණන් වහන්සේගේ අපගේ අනර්ඝ වූ යේසුස් වහන්සේගේ, ආශිර්වාදලත් අපගේ සැනසිලිදායක ශුද්ධාත්මයාණන් වහන්සේ පාමුල වැතිරී සිටිය හැකිය.

ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඔබගේ ප්‍රේමය අළුත් කරගන්න.

(ඒ.ඩබ්. ටෝසර් විසිනි.) (1897-1963)

කිතුණු ඇදහිලිවතුන් ඔවුන්ගේ ගැලවුම්කරුවාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රියමනාප බව නැවත සොයා ගැනීමේ විශාල අවශ්‍යතාවය තේරුම් ගෙන පසුතැවිලි වන්නේ නම් අපගේ සභාවන්වල ඇති අපගේ අධ්‍යාත්මික ශීතල බව සහ උදාසීනත්වය පිළිබඳ ගැටළු ඉක්මනින් පහව යනු ඇත.

අපගේ පියවරුන් දැන සිටි ප්‍රේමයේ සහ ආශාවේ තිවුරුතාවයෙන් කිතුණුවන් නැවතත් අපගේ ස්වාමීන් වන යේසුස් වහන්සේට ප්‍රේම කිරීමට පටන් ගත යුතු බවට මගේ සැලකිල්ල නිරන්තරයෙන් අවධාරණය කිරීමට මට හොඳ ශුද්ධලියවිලි පදනමක් ඇත. අපි පුද්ගලයන් වශයෙන්, සභාවන් වශයෙන් හෝ නිකායන් වශයෙන් පසු බැසීමට පටන් ගන්නා විට මූලික වශයෙන් අපට ඇති වරද කුමක්ද ... ? **“නුඹේ පළමු ප්‍රේමය අත්හැරියෙහිය යන කාරණය නුඹට විරුද්ධව මට ඇත්තේය. ”** (එළිදරව් 2:4) යනුවෙන් පැවසීම තුළ යේසුස් වහන්සේම අපට පැහැදිලි පිළිතුරක් ලබා දී තිබෙන සේක. උන්වහන්සේ ප්‍රථම ප්‍රේමය ලෙස කථා කළේ අනුපිළිවෙල පිළිබඳව නොව උන්වහන්සේ කෙරෙහි ඇති අපගේ ප්‍රථම ප්‍රේමයේ ස්වභාවය (ප්‍රමාණය) පිළිබඳවයි.

යේසුස් වහන්සේගේ මෙම වචන අපගේ කාලයේ කිතුණු සභාවල විශාල දුර්වලතාවයක් පෙන්නුම් කරයි. අපි ක්‍රිස්තුස් වහන්සේව දැන හඳුනාගැනීමට යන්නේ දැන හඳුනාගැනීමේ සහ සහයෝගීතාවයේ පොහොසත් සම්පතාවයකින් නොවන බව පෙනේ. නමුත් අපි ඒ ගැන කථා කිරීමටවත් කැමති නැත්තේ ඇයි ... ? ආත්මික ආශාව සහ අපගේ ගැලවුම්කරුවාණන්ගේ ප්‍රියමනාපය ගැන කිසිවක් අපට අසන්නට ලැබී නැත. අපි උන්වහන්සේ සමඟ සහයෝගීතාවයට යොමුවුවහොත් සියලු බාධක බිඳ දමනු ඇත. මෙම ආයාචනය අපේ පොත්වලට පැමිණෙන්නේ හෝ ගුවන් විදුලි පණිවිඩ වලින් ඔබට ඇසෙන්නේ හෝ නැත. අපේ දේවස්ථානවල එය දේශනා කරන්නේද නැත. යේසුස් වහන්සේට තමන්ගේම අය සමඟ මිත්‍රත්වය වර්ධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට හැකියාව ඇති බව අපට විශ්වාස කළ නොහැකිද ..? දෙවියන් වහන්සේව දැන හඳුනා ගැනීම එක් දෙයකි. නමුත් කැපවීමෙන් ඉදිරියට යාම සහ දැන හඳුනාගැනීමේ තීවුරතාවයකින් හා පොහොසත්කමින් දෙවියන් වහන්සේව අත්විඳීම ඊට වඩා වැඩි දෙයකි. අපෝස්තුළු පාවුල් මෙය දැන සිටි අතර ඔහු මෙලෙස පැවසුවේය. **“යම් අන්දමකින් මළවුන්ගෙන් නැගිටීමට පැවිණෙන ලෙස උන්වහන්සේ සහ උන්වහන්සේගේ නැවත නැගිටීමේ බලයත්, උන්වහන්සේගේ දුක්වල පංගුකාරකමත් දැනගන්නා පිණිසත්ය.”** (පිලිප්පි 3:10-11) අපගේ ගැලවුම්කරුවාණන්ව වඩා හොඳින් දැන සිටිය යුතු බවේ බොහෝ බලවත් හේතු අතර නිසැකවම පළමුවැන්න නම් උන්වහන්සේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නැමති පුද්ගලයාවීමයි. උන්වහන්සේ පුද්ගලයෙක් බවත් සදාකාලික පුත්‍රයාණන් බවත්, අපි සියලුදෙනාම එකඟ වන්නෙමු. නමුත් ඔබත්, මමත් භුක්තිවිඳීමට නිර්මාණය කර ඇති සෑම දෙයකම උල්පත උන්වහන්සේ බැවින් අපි උන්වහන්සේට නමස්කාර කිරීමට යොමු වෙනවාද .. ?

මූලාශ්‍රය සහ උල්පත

උන්වහන්සේ සියලු සත්‍යයේ උල්පතයි. එපමණක් නොව සත්‍යයත් උන්වහන්සේය. උන්වහන්සේ සියලු සුන්දරත්වයේ උල්පත හා ශක්තියයි. නුමුත් උන්වහන්සේම අලංකාරයයි. උන්වහන්සේ සියලු ප්‍රඥාවේ උල්පතයි. එපමණක් නොව ප්‍රඥාවේ සහ දැනුමේ සියලු වස්තූන් උන්වහන්සේ තුළ සැඟවී ඇත. අපගේ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සියලු කරුණාවල උල්පතයි. උන්වහන්සේ සියළු ජීවයේ උල්පත සහ මූලාශ්‍රයයි. නමුත් උන්වහන්සේ ඊටත් වඩා වැඩිය. ජීවනය මම යැයි කීමට උන්වහන්සේට හැකිවූ සේක. උන්වහන්සේ ආදරයේ උල්පතයි. නමුත් නැවතත් ඊටත් වඩා වැඩියෙන් උන්වහන්සේ ප්‍රේමයයි.

උන්වහන්සේ නැවත නැගිටීම වන අතර උන්වහන්සේ අමරණීය වන සේක. ගීත රචකයෙකු පැවසූ පරිදි පියාණන් වහන්සේගේ තේජසේ දීප්තිය සහ පියාණන් වහන්සේගේ මුහුණේ හිරුඑළිය යෙසුස් වහන්සේය. තවත් ගීතකාවක සැමවිටම ඇතුළත් නොවන පද දෙකක්වත් ඇත. එය අවංකව හා යතාර්ථවාදයෙන් අපට පවසන්නේ අනෙක් සියල්ල විනාශ වී නොපෙනී ගිය විට ආයෙත් පවතින්නේ යේසුස් වහන්සේ පමණක් බවයි. එක් පදයක පවසන්නේ ප්‍රෘතුවියේ සුන්දරම අලංකාරය ස්වර්ගයේ දීප්තිමත් තේජස යේසුස් වහන්සේ තුළ දිග හැරුණු බවයි. ලෝකයේ බැබළෙන සියල්ල උන්වහන්සේගේ පාරිශුද්ධත්වය ඉදිරියේ ඉක්මනින් පිරිහී යන බවයි. සැබෑ ප්‍රේමය තුළ උද්යෝගයක් ඇත. අපගේ ගැලවුම්කරුවාණන්ට ප්‍රේම කරන කිතුණුවන් වන අපි උන්වහන්සේ කවුද ..? උන්වහන්සේ කෙබඳු ද යන්න පිළිබඳව වඩාත් උද්යෝගයෙන් සිටිය යුතු බව මම සිතමි.

මට ලෞකික දේවල් ගැන උද්යෝගිමත්වීමට හෝ වැයවීමට නොහැකි නිසා මාගේ මිතුරෙක් තරමක් කෝපයට පත්ව ඇත. මිතුරෙකු මිල අධික මෝටර් රථයක් පදවාගෙන යන විට මට බිය උපදව ආකල්පයක් ඇති කළ නොහැකිය. මනුෂ්‍යයන් ඔවුන් ගොඩනගන අලංකාර නව නිවාස ගැන විස්තර කරන

6 පිටුවට

5 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි...

බව මට ඇසේ. ඔවුන්ගේ කටහඬේ උද්යෝගීතාවය ඇත. නමුත් දෙවියන් වහන්සේගේ වචනය මට බලකර සිටින්නේ මා දකින නිවස හෝ නගරය එහි අත්තිවාරම ගොඩ නැගීම සහ නිර්මාණය කිරීම දෙවියන් වහන්සේ වන බවයි. එබැවින් මේ ලෝකයේ කිසිම මනුෂ්‍යයෙකු විසින් ගොඩනගන ලද නිවසක් ගැන නැවත කිසිදාක කලබල විය නොහැකි බව මතක තබා ගැනීමට මට බලකරයි.

විශේෂ ආකාරයේ කිතුණුවන්

මේ වචන ලියූ මනුෂ්‍යයා දිනෙන් දින යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සමීප දැන සිටින්නට ඇත. මේ ආකාරයෙන් ගැලවුම්කරුවාණන්ට දැනගැනීමේ වටිනාකම ගැන ඔහු දැන සිටියා විය හැකිය. නමුත් මනුෂ්‍යයන් එම මිලය ගෙවීමට කැමති නැත. බොහෝ කිතුණුවන් තමන් යටත්ව සිටි අපිරිසිදු, හානිකර සහ දරුණු පාපකාරී දේවල් සම්බන්ධයෙන් කිතුණු ධර්මයේ ගෙවිය යුතු මිල ගැන භක්තියෙන් කථා කරති. ඔවුන් නරක දේ අත්හැරීම ගැන කථා කරති. නමුත් පාවුල්තුමා පැවසුවේ ක්‍රිස්තුස් වහන්සේ උදෙසා නරක දේ මෙන්ම හොඳ දේත් යටත් කර භාර දුන් බවයි. **"එසේ වී නමුත් මට ලාභව තිබුණු යම් යම් දේව ක්‍රිස්තුස් වහන්සේ නිසා අලාභයයි සිතීමට පැවිණියෙමි."** (පිලිප්පි 3:7)

එයින් ඔහු අදහස් කළේ තවමත් නීත්‍යානුකූලව සහ සදාචාරාත්මකව ඔහුට අයිති දේවල්, තවමත් මේවා මාගේය. ක්‍රිස්තියානි ආගම ඒවා මාගෙන් ගන්නේ නැත කියාය. ඒ සියල්ල මම උන්වහන්සේට භාරදෙනව. මට වඩාත් යහපත් දේ සොයාගෙන ඇති නිසා මම සියල්ල උන්වහන්සේට භාරදෙනව කියා ඔහු පිලිප්පිවරුන්ට හඟවා දුන්නේය. සියලු ප්‍රඥාව, අලංකාරය, සත්‍යය සහ අමරණීයත්වය ගලා එන උල්පත වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමඟ සිටිමි. ඒ දේ ඔහු සොයාගෙන තිබුණි. බෙහෝ කිතුණුවන් තවමත් ඉගෙන ගෙන නැති දෙයක් පාවුල් දැන සිටියේය. මිනිස් හදවත රූප නමස්කාරයට ගොඳුරු වන බවත්, හොඳ දේවල අන්තරාය පවතින්නේ එහි බවත් ඔහු දැන සිටියේය. අපි නරක, නපුරු දේ භාර දී ඇත. නමුත් හොඳ දේවල් අල්ලාගෙන සිටින්නෙමු. ඒවාට නමස්කාර කිරීමට අපි නැඹුරු වන්නෙමු. එය ඔබ සහ දෙවියන් වහන්සේ අතර දේපල, පවුල කීර්තිය හෝ ආරක්ෂාව, ඔබේ ජීවිතය වුවත් අවසානයේ දී ඒවාට නමස්කාර කරනවා ඇත.

අපගේ ආත්මාර්ථකාමීත්වය ග්‍රහණය කර ගැනීම සහ අපගේම ජීවිත මත එල්ලී සිටීම ගැන යේසුස් වහන්සේ අපට අනතුරු ඇගවූ සේක. උන්වහන්සේ ඉගැන්වූයේ මේ ලෝකයේදී අපේ ජීවිතය කොයිතරම් වැදගත්ද කියාය. මේ ලෝකයේ දී අපි සියල්ල ලබාගත්තත් අපගේ ජීවිතය නැති වුවහොත් අපට සියල්ල අහිමිවන අතර දෙවියන් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීමට වඩා පොළොවේ ආරක්ෂාව කෙරෙහි විශ්වාසය තැබීම ගැන අනතුරු ඇගවූ සේක. අපි හැමෝටම ආරක්ෂාව පිළිබඳව සහතිකයක් අවශ්‍ය වේ. නමුත් අපට මෙම අදහස අපෝස්තුළු පාවුල්ගෙන් ලැබුණේ නැත. මේ ලෝකයේ (ජීවිතයේ) දේවල් සම්බන්ධයෙන් ඔහු සුරක්ෂිතව සිටියේ නැත. ඔහු දිනපතා මිය ගිය බව පැවසුවේය. මේ ලෝකයේ ආණ්ඩු සමඟ හෝ මුහුදේ කුණාටු සහිත අවස්ථාවන් සමඟ ඔහු සැම විටම දුෂ්කරතාවලට මුහුණ දුන්නේය.

අපට ආරක්ෂාව අවශ්‍යයයි

සහෝදරයෙනි, අපට මේ ජීවිතයේ ආරක්ෂාව සහ පැමිණෙන්නා වූ ලෝකයේ සදාකාලික ආරක්ෂාව අවශ්‍ය වේ. නමුත් පාවුල්තුමා පැවසුවේ මා ක්‍රිස්තුස් වහන්සේ විසින් අල්ලාගෙන ඇති නිසා මම සියල්ලම ප්‍රතික්ෂේප කර සහ තමාගේ නොවේ යැයි කියා සිටින බවයි. දැන් දෙවියන් වහන්සේ පාවුල්ට ඉඩ දුන් සමහර දේවල් තිබුණි. උන්වහන්සේ ඔහුට පොතක් හෝ දෙකක් මිලද ගැනීමට ඉඩ දුන් සේක. ඔහුට වස්ත්‍රයක් හෝ සළුවක් ලබාදුන් සේක. එක් අවස්ථාවක ඔහුට වසර දෙකකට ඔහුගේම මුදලින් කුලී නිවසක් ලබා ගැනීමට ඉඩ දුන්සේක. නමුත් පාවුල් අපට ලබා දුන් ආදර්ශය නම් දෙවියන් වහන්සේ ඔහුට ලබා දන ඕනෑම දෙයක් කිසි දිනෙක ඔහුගේ හදවත ස්පර්ශ නොකළ බවයි.

ඇත්ත වශයෙන්ම අප හදවතින් බැඳ තබන ඕනෑම භාහිර වස්තුවක් ශාපයක් බවට පත්වේ. පාවුල් පැවසුවේ මම ක්‍රිස්තුස් වහන්සේව අල්ලාගන්නා පිණිස ඒ සියල්ල අත්හරින බවයි. දෙවියන් වහන්සේ සමඟ ඇති ඔහුගේ සම්බන්ධතාවය විනාශ කිරීමට තරම් ඒ දේවල් වැදගත්වීමට ඔහු කිසිවිටෙක ඉඩදුන්නේ නැත. පාවුල්තුමාගේ ආදර්ශය සහ අවවාදවලට ක්‍රිස්තුස් වහන්සේත් ප්‍රකාශ කර තිබෙන දේ එකතු කලාම අපගේ වර්තමාන කිතුණුවන්ගේ සමහර ඉගැන්වීම් ප්‍රශ්න කිරීමට හේතුවේ. අප විසින් තරමක් විනෝදජනක භූමික ජීවිතයක් ගත කළ හැකි නමුත් අපව නිරයෙන් ගලවා ගැනීමටත් අනිත් පැත්තේ ඇති මන්දිරවලට අපව ගෙනයාමටත් යේසුස් වහන්සේට අවශ්‍ය බව ඔවුන් උගන්වති.

දැන් එය නව ගිවිසුමේ ඉගැන්වීම නොවන අතර නිසැකවම පාවුල්තුමා මේ ලෝකයේ දේවල් දෙස බැලූ ආකාරය නොවේ. පාවුල්තුමා පැවසුවේ ක්‍රිස්තුස් වහන්සේ කොයිතරම් අසීමිත ලෙස ආකර්ෂණීයද කියනවා නම් එම ආකර්ෂණීය බව ලෝකයේ ඇති සෑම වටිනාකමක්ම ඉවත දැමීමට බලකල බවයි. පාවුල්තුමා ගමාලියෙල්ගේ පාමුල ඉගෙනත් උගත් පුද්ගලයෙකි. ඔහුගේ බුද්ධිමත්කම ගැන අපි ඔහුට ගරු කරන්නෙමු. නමුත් පාවුල්තුමා පැවසුවේ "ඒ සියල්ල කුණු ලෙස සලකන බවයි. පාවුල්තුමා ඔහුගේ උපත පිළිබඳ ලේඛනය සහ ඔහුගේ පියවරුන්ගේ ආගමික උරුමය අතර සිටීම ගැන කථා කළ නමුත් පසුව සාක්ෂි දුන්නේ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කිසිවක් ගණන් නොගන්නා බවයි.

අපි ආඩම්බර වන බොහෝ දේ අපට ඇති බව පැවසිය යුතුය. අපගේ සමහරෙක් අපගේ ජාතික හා සංස්කෘතික මුතුන් මිත්තන් ගැන පුරසාරම් දොඩවන්නේ ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන ලොකිකව සිටින නිසාය. අපි දේවල් ගැන ආඩම්බර වන අතර අපට කළ හැකි දේ ගැන ආඩම්බර වන්නෙමු. නමුත් පාවුල්තුමා පැවසුවේ මනුෂ්‍යයෙකු ලෙස මට ආඩම්බර විය හැකි සෑම දෙයක්ම යේසුස් ක්‍රිස්තුස් වහන්සේ නිසා අලාභ යැයි සලකනවා මිස ගණන් ගන්නේ නැති බවයි. එබැවින් ගැලවුම්කරුවාට ප්‍රේම කිරීමට සහ අනුගමනය කිරීමට අපව වළක්වන දේවල් අත්හැරීමට පාවුල් අපට නිසි චේතනාවන් ලබදෙයි.

දෙවියන් වහන්සේව දැන ගැනීමට විවෘත වූ අභිප්‍රාය

මා කියවා ඇති සියළුම ශුද්ධවන්තයන් සහ පියවරුන් උගන්වා ඇත්තේ ඔබ දෙවියන් වහන්සේව විශ්වාස කළ යුත්තේ ඔබගේ කැමත්තේ විවෘත චේතනාවෙන් බවත්, පසුව අනෙක් දේවල් අනුග මනය කළ යුතු බවත්ය. දෙවියන් වහන්සේට විවෘත චේතනාවක් ඇතිව සිටි එම අතීත ශුද්ධවන්තයන් ප්‍රායෝගික මනුෂ්‍යයන් විය. අපට දැනුනත් නැතත් ඇදහිල්ලෙන් ඉදිරියට යන ලෙස ඔවුන් අපට අවවාද කර ඇත. ඔවුන් අපට උපදෙස් දී ඇත්තේ සැමවිටම යාච්ඤා කරන ලෙසයි. අපව සෑම විටම හැඟීම්වලින් ඔසවා තබන බව ඔවුන් කිසිවිටෙකත් ඉගැන්වූයේ නැත. ඔබේ ආත්මික දියුණුව දෙවියන් වහන්සේට විවෘතව තිබිය යුතු බව ඔවුහු දැන සිටියහ. දෙවියන් වහන්සේව දැන ගැනීමට අපට විවෘත වූ අභිප්‍රායක් තිබේ නම් ලෝකය, මනුෂ්‍යයන් සහ කාරණා අපගේ දෙපා යට තැබීමට සහ අපගේ හදවත් එකම ප්‍රේමවන්තයාණන්ට පමණක් විවෘත කිරීමට හැකිවීම තුළ උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් බව ඒත්තු ගැනීමට හැකිවේ.

අපගේ සම්බන්ධතාවයන්වල නියම සමතුලිතභාවය සඳහා ස්වාමිපුරුෂයා සහ භාර්යාව, පියා සහ පුතා. මව සහ දියණිය ව්‍යාපාරිකයා සහ හවුල්කරු , බදුගෙවන්නා සහ පුරවැසියා යන මේ සියල්ල නියමිත ස්ථානයේ ඇත. නමුත් හදවතේ ගැඹුරේ ඇත්තේ එකම පෙම්වතා පමණි. වෙන ප්‍රතිවාදියෙකුට එහි ඉඩක් නොමැත. එය එසේ විය යුතු බව දෙවියන් වහන්සේ අවධාරණය කළේ ඇයි .. ? අපගේ අවබෝධය සහ අපගේ තර්කය බිඳදැමිය යුතු අතර අපගේ සම්පූර්ණ කාරණය දෙවියන් වහන්සේ මත තැබීම උන්වහන්සේගේ අභිප්‍රාය වේ. අන්ධකාරයේ හ විරුද්ධවාදී (පීඩාවේ) කාලය බොහෝ දෙනා දැන සිටි අතර දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ පූර්ණත්වයෙන් පිරි ඔවුන් ඉදිරියට යාමට උත්සාහ දරන්නෝය. ඔබ දෙවියන් වහන්සේට සහ ක්‍රිස්තුස් වහන්සේව විශ්වාස කර ඔබට හැඟුණත් නැතත් ඔබ ඉදිරියට ගොස් උන්වහන්සේව විශ්වාස කිරීමට සහ කීකරුවීමට යොමු විය යුතුය ඔබ කැමති වුවන් නැතත් යාච්ඤා කළ යුතුය. ඔබ දේවල් නිවැරදි කර ඔබගේ නිවසේ සහ ඔබගේ කාර්යයන්වල සබඳතා සකස් කරගෙන ඔබ කැමති වුවත් නැතත් වැරදි දේවල් සහ ඔබට බාධාවක් වූ දේවල් අත්හැරිය යුතුය. මෙම ඇදහිල්ල දෙවියන් වහන්සේට විවෘත වූ චේතනාවකි. මම ඔබට මෙය පැවසිය යුතුය. අප අන්ධකාරයෙන් සහ දැඩි වේදනාවෙන් පිටත්ව එන විට දෙවියන් වහන්සේ බෙතෙල්ට ගෙන එන සේක. සොහොන් ගෙයින් පිටතට ගෙන නැවත නැගිටවනු ලබයි. උන්වහන්සේ ඔබව අන්ධකාරයෙන් ආලෝකයට ඔසවනු ලබයි.

යේසුස් වහන්සේට ප්‍රේම කිරීම උන්වහන්සේ ගැන පමණක් දැන ගැනීම යන්නෙන් අදහස් කරන්නේ එයයි. යේසුස් වහන්සේගේ අලංකාරය මනුෂ්‍යයන් දැන සිටිය උන්වහන්සේගේ තේජස අගේ කාලයේ දී නැවත ලබා ගැනීමට මම යාච්ඤා කරන්නේ කෙසේද ..? "යේසුස් වහන්සේ උන්වහන්සේම වන සේක කියා ආචාර්ය ඒ.බී. සිමයන් ඔහුගේ පණිවිඩයේ කේන්ද්‍ර කරගත් නිසා ඔහු පරම්පරාවක් විශ්මයට පත් කරමින් ආශිර්වාදයට ගෙනාවේය. ආචාර්ය සිම්සන්ට බයිබල් සම්මන්ත්‍රණයක දේශනා කරන්නට එංගලන්තයට යන්නට කියූවේය. ඔහු විශුද්ධකරණය පිළිබඳව පණිවිඩ තුනෙන් තුන්වැන්න දේශනා කිරීමට තීරණය කළේය. එය නරක සළකුණු ඔබ තුළ යනුයි." කිතුණු ජීවිතය තුළ ශුද්ධ සහ ජයග්‍රාහීවීමට මාර්ගය පරණ මනුෂ්‍යාව මැඩපැවැත්වීමයි. පළමු මනුෂ්‍යාව මැඩපවත්වා විශුද්ධ තත්ත්වයට පත්කළ යුතු බව ඔහු සිය දේශනයෙන් පැවසීය. දෙවන මනුෂ්‍යා වන යේසුස් වහන්සේ පරණ මනුෂ්‍යයාගේ ස්වභාවය මුලින් උපුටා දැමීමෙන් ලොකික ජීවිතයෙන් මුදාගත් සේක. පරණ මනුෂ්‍යයාව ඉවත්කර මුලින්ම උගුලා දමන්න.

ආචාර්ය සිම්සන්ට "යේසුස් වහන්සේ , උන්වහන්සේම වන සේක" යන පාඨයට ඇතුල්වීමට සිදුවූ අතර උන්වහන්සේ ජයග්‍රහණය ලබා ගැනීමට ගත් උත්සාහයන්, පොරබැදීම් පිළිබඳ සාක්ෂි ලබා දුන්නේය. සමහර විට මට ඒවා ලබාදුන්නා යැයි මම සිතමි. මම වැරදි ස්ථානයේ සිට බලා සිටියා යැයි දැන ගැනීමට පැමිණීම කොපමණ ආශිර්වාදයක් ද ... ? මම ජයග්‍රහණය, විශුද්ධ කිරීම, මුදාගැනීම, පවිත්‍රත්වය, ශුද්ධකම යන සියලුම දේ සොයාගත්තේ වෙනත් වට්ටෝරුවකින් නොව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් වන සේක.

ගැඹුරු කිතුණු ජීවිතයේ මූලික ඉගැන්වීම මෙයයි. එය නම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේම අප තුළ සහ අප තුලින් මහිමයට පත්වීමට ඉඩ හැරීමට ඇති කැමැත්තයි. අපගේ අරමුණු සඳහා යේසුස් වහන්සේව භාවිතා කිරීමට උත්සාහ දැරීම අත්හැර උන්වහන්සේගේ මහිමය සඳහා අප තුළ ක්‍රියාකිරීමට ඉඩ ලබාදීමට ඇති කැමැත්තයි. මා උද්යෝගයෙන් සිටින්නේ එවැනි උද්යෝගක් වෙනුවෙනි. එය එකම ආකාරයේ ආත්මික ප්‍රබෝධයක් සහ අළුත් කිරීමක් වන අතර එය ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉදිරියෙහි මනුෂ්‍යයන්ව උද්යෝගයෙන් අවුලවනු ඇත.

වරක් එය ආශිර්වාදයක් විය. දැන් එය ස්වාමීන් වහන්සේය. "

"... ඇරත් ප්‍රේමය පව් රාශියක් වසන බැවින් සියළු දේවලට වඩා එකිනෙකා කෙරෙහි බලවත් ප්‍රේමයක් ඇතුව සිටපල්ලා , (1 පේතෘස් 4.8)

උන්වහන්සේ වෙනුවෙන්

(එස්.ජේ. හම්ප්රේ විසිනි.)

වසරකට පෙර ශීත සෘතුවේදී අපේ නිවස ගිණිගත්තේය. ඒ මධ්‍යම රාත්‍රියේ දී අපි නිදා සිටියෙමු. ගිණිදැල් මුලින්ම දැක තිබුණේ අපගේ අසල්වැසියෙකු විසින් වන අතර ඔහු අනතුරු ඇඟවීම ලබාදුන් පසු එකවරම නිවසේ දොරටුව පුපුරා ගියේය. නිවස දුමෙන් පිරී තිබූ අතර ගින්න ඒ වන විටත් අපි හැමෝම නිදා සිටි කාමර දිවෙන පඩිපෙළට ඇවිලී තිබුණි. අපේ දැස් නොපෙනී හුස්ම හිරවී සිටි අතර අප පණපිටින් එළියට ආපු එක ආශ්චර්යයක් විය. අපේ අසල්වැසියාගේ වීරෝධාර ධෛර්යය හා ශක්තිය පමණක් අපව ගින්නෙන් දැවෙන පඩිපෙළින් එලියට ගෙනාවේය. නමුත් ඔහුගේ ජීවිතය අන්තරා සහිත තත්ත්වයක තිබුණේය. ඇත්ත වශයෙන්ම අපි සිතුවේ ඔහු එම ස්ථානයේම මිය යනු ඇති බවයි. අපව ආරක්ෂා කිරීමේ චේතනාවෙන් ගින්නට නිරාවරණය වූ ඔහුගේ දැත් සහ පපුව පිළිස්සී ගොස් තිබුණි. ඔහු ඔහුගේ පෙනහළු වලට පාහේ ගිණි උඳුනක් වැනි වාතය ඇදගෙන තිබුණි. අපේ අන්තිම දරුවාව දැතින් ඔසවාගෙන ඔහු එළියට එන විට ඔහු සම්පූර්ණයෙන්ම වෙහෙසට පත්ව සිටියේය. ඒ පැයේ තිබුණා වූ දුක මට කිසිදාක අමතක වන්නේ නැහැ. ඔහු අපව බේරාගෙන තිබූ නමුත්, ඔහු අප වෙනුවෙන් මිය යන බවක් පෙනෙන්නට තිබුණි. අපේ අවාසනාව ගැන සියලු සිතුවිලි එකවරම අපෙන් ඉවත්ව ගියේය. හොඳම වෛද්‍යවරුන් කැඳවා අපි ඔහුව ප්‍රවේශම් සහිතව ඔහුගේ නිවසට රැගෙන ගියෙමු. හදිස්සි අනතුර වළක්වා ගත් විට ඔහු ජීවිත කාලයටම ආබාධිත තත්ත්වයට පත්නොවූයේ නම් ඔහුව සාමාන්‍යය සෞඛ්‍යය තත්ත්වයට ගෙන එමට මාස කිපයක්වත් ප්‍රවේශමෙන් සාත්තු කළ යුතු බව පැහැදිලි විය.

අපේ පවුලේ ප්‍රතිචාරය

දැන් එය අපේ වාරය විය. ඔහු කම්කරුවෙකු වූ අතර ඔහුගේ පවුල සම්පූර්ණයෙන්ම යැපුණේ ඔහුගේ දෛනික ඉපයීම මතය. අපගේ කාර්ය තීරණය කිරීමට වැඩි කාලයක් ගත නොවීය. ඇත්තටම ඒ ගැන විවාදයක් තිබුණේ නැත. අපි හැමෝගෙම පවුලේ බාලම දරුවා දක්වා වූ පොදු සහ ක්ෂණික සිතුවිල්ල වූයේ මේ පවුලේ සම්පූර්ණ රැකවරණය අප විසින්ම එකවර භාරගත යුතු බවයි. ඕනෑම නෑදෑයෙකුගේ බැඳීමකට වඩා ශක්තිමත් බැඳීමක් දැන් ඔවුන්ව අප හා සම්බන්ධකර ඇති අතර කුමක් කළ යුතු දැයි අප මොහොතකටවත් පසුබවට නොවූයෙමු.

මට පහසු සහයක් ලබාදෙන ව්‍යාපාරයක් මා සතුව තිබූ අතර අපි නිදහස් ආකාරයෙන් අපගේ ප්‍රමාණයට වඩා වැඩියෙන් ජීවත් වුනෙමු. අපට මේ මනුෂ්‍යයාව බලා ගැනීමට පුළුවන්ද බැරිද කියා ඇසීමට අපි නැවතුනේ නැත. මෙය මුලින්ම කළ යුතු බව අපි එකවරම විසඳා ගත්තෙමු. පසුව ඉතිරිව ඇති දේ මත අපි කෙසේ හෝ ජීවත්වීමට උත්සාහ කළෙමු. අපගේ නිවසේ සේවය කළ කාන්තාවක් යොමු කර මින් අපව බේරාගත් මනුෂ්‍යයාගේ හදවත බිඳී ගිය බිරිඳව තම නිවසේ සියලුම කාර්යයන් වලින් මුදා ගැනීමට සම්පූර්ණයෙන්ම කැපවී සිටීමට අපි කටයුතු කළෙමු. ඔවුන් ඉතා මෘදු මොළොක් ලෙස බැඳී සිටි අතර ඇයට තරම් හොඳින් කිසිවෙකුට අසනීපව සිටි අපගේ අස්ලැවැසියාව බලා ගැනීමට නොහැකි විය.

මගේ වැඩිමහල් දියණිය ඉක්මනින්ම සංගීතය පිළිබඳ රැකියාවක් සහ ළදරු පාසලක රැකියාවක් සොයාගත්තේය. අපේ පවුලේ අයව බේරාගත් අසල්වාසියාගේ පවුලේ අය සහ ඒ කුඩා දරුවන් දැන් අපේ හදවත් වලට පැමිණ ඇත. ඒ උතුම් අරමුණ වෙනුවෙන් යමක් උපයා ගැනීමට හෝ ඉතිරි කිරීම කොයිතරම් උතුම් අභිප්‍රායක්වී ඇද්දැයි බැලීම මහත් සතුටක් විය. විශේෂයෙන්ම අපේ අභීත මිතුරාගේ බාලම දරුවාව බලා ගැනීමට අපේ පවුලේ අන්තිමයා වන චාලි ක්‍රියා කරන ආකාරය දකින විට ඇස්වලට කඳුළු පැමිණේ. අසල්වැසියාගේ දරුවාට වඩා චාලි වැඩිමහල් වූයේ එක අවුරුද්දකිනි. එම දරුවා තමාගේම ලෙසින් වැඩෙන තෙක් චාලිට ඇඳුම් පැළඳුම්, පාසල් පොත් හෝ සෙල්ලම්බඩු වලින් කිසිවක් භුක්තිවිඳිය නොහැකි විය.

ඇත්ත වශයෙන්ම මෙය අපේ පවුලේ සියල්ලන්ගේම ස්වභාවය බවට පත්විය. නොදැනුවත්වම අපි භාරගත් දේ අපට කළ හැකි ද කියා ඇසීමට අපට සිතුණේ නැත. අප උදෙසා දුක්විඳින මේ දුප්පත් මනුෂ්‍යයාගේ කිසිම ශාරීරික වේදනාවක් අපට භාරගත නොහැකි විය. නමුත් එය දැන ගැනීමට අපට උවමනා විය. නමුත් ඔහු වෙනුවෙන් අපි කළා වූ සමහර දේවල් තුලින්, අපගේ ජීවිත වැය කළ සමහර දේවල් නිසා, සැබෑ ආත්ම පරිත්‍යාගය නිසා, නිරන්තර වේදනා දරා ගැනීම නිසා. මහත් තෘප්තියක් ලැබුණි. කෙසේ හෝ අපට හැඟී ගියේ අපගේ මහත් වගකීම අවධාරණය කිරීමටත්, අපගේ කෘතඥතාවය ඔහුට පෙන්වීමටත් අති එකම මාර්ගය එය බවයි. ඔහු අප වෙනුවෙන් විඳි මහත් දුක් කම්කටොළුවලදී ඔහු සමඟ සුළු වශයෙන් හෝ දුකිවිඳිය හැකි එකම මාර්ගය එය විය.

සෝදිසි කිරීම්

මේ දේ කරන එක ගැටුමක් තුළ ගැටුමක් (පොරබැදීමක්) තිබුණේ නැහැ ගියා මම කියන්නේ නැහැ. පළමු දින කිහිපයේ උද්යෝගයෙන් පසු අපගේ මනසට යුතුකම පිළිබඳ හැඟීමක් ඇති කරවමින් අපගේ හැඟීම් ශක්තිමත් කිරීම බොහෝ විට අවශ්‍ය විය. අපි පදිංචියට ගිය ස්ථානයේ අපහසුකම් තිබුණි. කලින් තිබුණා වූ අපගේ රසාස්වාදයන් සහ පසුව දැඩි ලෙස තහවුරු විය. අප වෙනුවෙන් ක්‍රියා කළ ඒ දිළිඳු මනුෂ්‍යයා සහ ඔහුගේ පවුලේ අය අපගේ හිස් පුරුදු බවට පත්විය. සමහර විට ඔවුන්ව යටපත් කිරීමට (අමතක කිරීමට) සැබවින්ම පොරබැදීමක් පැවතුණි.

එක් දවසක් මාගේ ව්‍යාපාරික මිත්‍රයෙක් එයා සාදන අළුත් ගෙදර බලන්න මාව එක්කන් ගියේය. මම එය බැලීමට සතුටුව සිටියෙමි. මක්නිසාද මම කවදා හෝ එවැනි නිවසක් මා වෙනුවෙන් ගොඩ නගා ගැනීමට සැලසුම් කර තිබූ නිසාය. කාමර ඉඩකඩ සහිතව ඒවා බොහෝමයක් විය. නවීන පහසුකම් හෝ සුව පහසුව සඳහා අවශ්‍ය වන්නාවූ කිසිවක් මගහැරී තිබුණේ නැත. කලකට පෙර වාසස්ථානයක් පිළිබඳව ආශාව මා තුළ අළුත්වී බලවත් ශක්තියක් ලැබුණි. මා තුළම තෘප්තියක් (වින්දනයක්) නැවත හටගත්තේය. මා සිතන්නටත් පෙර මා මත වූ නව වියදම් ගැන මාගේ හදවතේ ඇති වූ කැළඹීම සහ නොඉවසිවන්තකම කලබලයක් දක්වා වර්ධනය විය. නමුත් එය මොහොතකට පමණි. මම එතැනින් ඉවතට යන විට මම ඇත්තටම සිතන්නේ කුමක්දැයි බැලීමට මම පටන් ගතිමි. මෙම නින්දිත සිතුවිල්ලෙන් මම මුළුමනින්ම නිදහස්වීමට අවශ්‍ය විය. එය තහවුරු කර ගැනීම සඳහා මම වහාම මාගේ බිරිඳ සමඟ ගොස් ඊළඟ බිම් කොටසේ ගෙයක් සෑදීම සඳහා ඉදිරි වර්ෂයේ දී ලැබිය හැකි පහසු කොන්දේසි සකස් කළෙමි. පසුව මම නියෝග කළේ මාගේ නිර්භීත, දුක්විඳින, අපව බේරා ගැනීමට කටයුතු කළ මනුෂ්‍යයාට ඇවිදින්නට පුළුවන් වන දවසේදී එහි ඔප්පුව ඔහුට ලබාදෙන ලෙසයි.

නව අවස්ථාවක්

අපේ මිතුරාට ඇවිදීමට හැකි වූ විට ඔහුගේ මනසෙහි යම් බරක් ඇති බව අපට පෙනී ගියේය. එය ඉක්මනින් පිටතට පැමිණියේය. ඔහු නගරයේ නොසලකා හරින ලද කොටසක පැවති මිෂන් පාසලක අධිකාරිවරයා විය. ඔහු නොමැති විට එය කණගාටුදාක ලෙස පහත වැටී තිබුණි. අපේ පවුලේ මුළු ගුරු මණ්ඩලයම ඊළඟ ඉරිදාම එම පාසල සඳහා ඉදිරිපත් විය යුතු බව මම විශ්වාස කළෙමි. එය අපගේ අලුත් කාර්යයක් කියා කීමට ලැජ්ජා වූයෙමි. නමුත් ඔහු වෙනුවෙන් අපි එහි සිට අපේ මුළු ආත්මයම එයට යොමු කළෙමි. දිළිඳු මනුෂ්‍යයාට එය ඉතා අනර්ඝව තිබූ බව දැකීම ඔහුගේ වර්ධනය වන උනන්දුව සහ සංඛයා පිළිබඳ අපගේ සතිපතා වාර්තා ඇසීම මහත් තෘප්තියක් විය. ශීත සෘතුවේදී ආශිර්වාදලත් පිඹීදීමක් ඇති වූ විට ඔහුගේ ප්‍රීතියට සීමාවක් නොවීය. එතැන් සිට ඔහු කැපී පෙනෙන දියුණුවක් පෙන්නුම් කළ බව පෙනෙන්නට තිබුණි. ඒ බිහිසුණු රාත්‍රියෙන් අවුරුද්දකට පසු අපේ අසල්වැසියා අපගේ මහත් ප්‍රීතියට පත්වූයේය. ඔහු බොහෝ දුරට සුව ලැබූ නිසා ඔහු නව නිවසට ගොස් නැවතත් ඔහුගේ පුරුදු රැකියාවට පැමිණියේය.

අපේක්ෂිත ප්‍රතිඵල

එම වසරේ ස්වභාවික නමුත් ආත්ම පරිත්‍යාගය තුළ අනපේක්ෂිත ප්‍රතිඵලයක් ඇති විය. ජීවිතය වෙනුවෙන් නිර්භීත සටනක යෙදෙන මේ මනුෂ්‍යයා වෙනුවෙන් පමණක් නොව අපට කිසි දිනෙක නොතිබූ ලෙස අපි එකිනෙකා වෙත ඇදී ගියෙමු. අපගේ ජීවිතවලට නව මෘදු මොළොක් බවක් සහ ඉවසීමක් ඇති විය. කෙසේ හෝ අපි සියලුදෙනාගේ හදවත් යොමු කළ පොදු සේවය සහ පරිත්‍යාගය අපව මෘදුකර සහමුලින්ම සහ හැඟීමේ එකමුතුකමකින් අපව එකතු කරගත් අතර එය සම්පූර්ණයෙන්ම අළුත් විය. එබැවින් එය අපගේ ගෘහ ජීවිතයේ ප්‍රීතිමත්ම කාල පරිච්ඡේදය බවට තහවුරු විය.

තවත් අනපේක්ෂිත ප්‍රතිඵලයක් වූයේ මම මගේ ව්‍යාපාරවල අඩිතාලම දෙස බැලූ විට එය මාගේ වඩාත්ම සාර්ථක වසරවලින් එකක් බව පෙනී ගියේය. ඇත්ත වශයෙන්ම මගේ අතේ එතරම් විශාල ශේෂයක් තිබුණේ නැත. මෙය සම්පූර්ණයෙන්ම අනපේක්ෂිත විය. කැපී පෙනෙන සාර්ථකත්වයක් නොතිබුණත් අපට මුහුණදීමට සිදුවී තිබුණු අවශ්‍යතා නිසා මගේම ව්‍යාපාරික පුරුදු සකස් වී ඇති බව පෙනී ගියේය. අත්‍යාවශ්‍ය නොවන වියදම් කපා හැර ඇති බවත් මගේ සේවකයන් ක්‍රමයෙන් දියුණු වී ඇති බවත් මම කෙසේ හෝ අතපසුවීම් නරක අවදානම් සහිත සහ අස්ථානගතවූ ණය වලින් ආරක්ෂා වී ඇති බවත් ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේගේ හස්තය අප සමඟ නිරතුරුවම තිබූ බවට නිරවුල් සහ මිහිරි කල්පනාවක් අපට තිබුණි.

ගින්න ඇතිවී පළමු අවුරුද්ද පැමිණි විට අපේ පවුලේ අය අපේ අත්දැකීම් සමලෝචනය කළේය. අපි ජීවිතයේ උසස් තලයකට පැමිණ ඇති බවත්, අප අතරින් කිසිවෙකුට නැවත පැරණි ආත්ම තෘප්තියට යාමට අවශ්‍යය නොවූ බවත්, අවබෝධවී තිබූ අතර, අපට නිහතමානී කෘතවේදී හැඟීමක් තිබුණි. මාස කිහිපයක් තිස්සේ අපගේ හදවත්වල නිශ්ශබ්දව වැඩෙමින් තිබූ කාරණාවක් විය. එනම් මේ මනුෂ්‍යයා වෙනුවෙන් අප කරන්නා වූ දේවල්වලට වඩා අපි ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් කොපමණ වැඩියෙන් කළ යුතුද කියාය.

අපේ උදැසන නමස්කාරයේ දී යෙසායා 53 වන පරිච්ඡේදය හෝ සුභාරංචි පොත්වල සඳහන් අපගේ ස්වාමීන් වහන්සේගේ ජීවිතයේ අවසාන දර්ශන කියවීමේ පසු දුක්විඳීම්, දැඩි වේදනාවන්, කිසි විටෙකත් අපගේ සිතුවිලි වලින් බැහැර නොවූ බව පෙනෙන්නට තිබුණි. අපගේ ස්වාමීන් වහන්සේගේ පරිත්‍යාගය සහ අප වෙනුවෙන් දුක්විඳීම් අපට සැබෑ කර දෙන්න. අපි ඇත්තටම දැවෙන ගින්නෙන් උදුරාගත් වෙළඳ නාම ලෙස සිටින්නෙමු. මෙය බොහෝ විට ආශාවෙන් සහ ආත්මයේ මෘදු මොළොක් බව සමඟ යේසුස් වහන්සේ වෙතට හැරීමට අපට බොහෝ හේතු විය. සමහර විට නව එළිදරව්ව විචිත්‍ර බව සමඟ අපට නේ යනු ඇත. අපව විශාල මිලයක් ගෙවා මිලදීගෙන ඇත. අපි අපටම අයිති නොවේ.

එබැවින් අපගේ සමාලෝචනය අවසානයේ දී විධිමත් ගිවිසුමක් තුළ අපගේ සම්පූර්ණ හදවත්වල නිහඬව වැඩෙමින් තිබූ අරමුණ නිසා අපි තවදුරටත් අප වෙනුවෙන් ජීවත් නොවනු ඇත. අපි මේ මනුෂ්‍යයා වෙනුවෙන් කළ දේම නොකඩවා අපේ ස්වාමීන් වහන්සේ වෙනුවෙන් කරන්නෙමු. අපේ මුළු වසර පුරාම අපි ක්‍රිස්තුස් වහන්සේගේ කාර්යය අපේ කාර්යය බවට පත්කර ගැනීම පහසු සහ ස්වභාවික ලෝකයේ වඩාත්ම සාධාරණ දෙයක් ලෙස පෙණුනේය. උන්වහන්සේගේ හදවතට සමීප වූ දේවල් අපේ හදවතට ගන්නවා කියලා මෙතැන් සිට උන්වහන්සේගේ සභාවේ දිළිඳුන්, කුඩා දරුවන් සහ තවමත් ලෝකයේ දුක්විඳින ගැලවීම නොලැබූ අය ගැවීමට ගෙනඒම අපගේ ජීවිතයේ ප්‍රධාන කාර්යය විය යුතුය. අපේ දුවලා අපේ කාමරවල බිත්ති මත "උන්වහන්සේ වෙනුවෙන් " කියා ආදර්ශ පාඨයක් හදලා එල්ලුවා එය ගැඹුරින් ඇති දෙයෙහි දුර්වල පිළිබිඹුවක් පමණක් වන අතර එය අපගේ හදවත් මත ස්ථිරව කොටා ඇති බව අපි විශ්වාස කරන්නෙමු.

"මාගේ ප්‍රිය දරුවෙනි, වචනයෙන්වත් දිවෙන්වත් නොව ක්‍රියාවෙනුත් සැබෑවෙනුත් ප්‍රේමකරමු." (1 යොහාන් 3:18)

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

අපගේ ප්‍රේමය සඳහා තේජාන්විත හේතුව

"අප ප්‍රේමකරන්නේ උන්වහන්සේ පළමුකොට අපට ප්‍රේම කළ නිසාය."

(1 යොහාන් 4:19)

අපි ක්‍රිස්තුස් වහන්සේට ප්‍රේමකරන්නේ දේව සේවකයා දේශනා කළ නිසා හෝ උන්වහන්සේගේ ධර්මය අපට ලබා දුන් නිසා හෝ අපගේ ස්වාමීන් වහන්සේ ඉගැන්වූ කාරණාවල එවැනි දේ ඇති බව අපි තේරුම්ගත් නිසා හෝ නොවේ. නමුත් අපි උන්වහන්සේට ප්‍රේම කිරීමට හේතුව වන්නේ උන්වහන්සේ අපට ප්‍රේම කළ නිසාය. (1 යොහාන් 4:19) ප්‍රේම කිරීමට හේතු කාරක වන්නේ ප්‍රේමයයි. උන්වහන්සේ අපට ප්‍රේම කළ නිසා අපි උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු. උන්වහන්සේ අපට ප්‍රථමයෙන් ප්‍රේම කළ නිසා දෙවනුව අපි උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු. මෙය ප්‍රායෝගිකව තිබෙන සත්‍යතාවයයි. අපි උන්වහන්සේට ප්‍රේම කිරීමට පෙර උන්වහන්සේ අපට ප්‍රේම කළ බව අපි දනිමු.

ගැලවීම ලැබීමට පෙර

ඔබ ගැලවීම ලැබීමට පෙර ඔබේ ජීවිතය දෙස ආපසු හැරී බලන්න. එහිදීත් උන්වහන්සේ ඔබට ප්‍රේම කළ සේක. සියල්ලේ දී ඔබ උන්වහන්සේට ප්‍රේම කිරීමට හේතුව කුමක්ද ... ? ඒ උන්වහන්සේ ඔබට ප්‍රේම කළ බව උන්වහන්සේ පැවසූ නිසාත් ඔබ එය විශ්වාස කළ නිසාත්ය. ව්‍යවස්ථාව හෝ බය නිසා ඔබ උන්වහන්සේට ප්‍රේම කළේ නැත. ඒවා ඔබව දැඩි කළේය. එය ඔබව උන්වහන්සේ වගුරන ලද රුධිරයෙන් මිලදීගෙන සමාව ලබාදෙන බව හඟවා දෙන අතර එම සමාව ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය තුළ ඔබ දුටුවේය. එබැවින් ඔබට ප්‍රේම කරන පිණිස උන්වහන්සේට උදව් කිරීමට ඔබට නුපුළුවන. මෙය මහත් වූ සත්‍යතාවයකි. ඔබ නොසැලකිලිමත් ලෙස ජීවත් වූ විට, ඔබ උන්වහන්සේගේ වචනය නොසලකා හරින විට යාච්ඤාවෙන් දණ නොනැමූ විට පවා උන්වහන්සේට ඔබට ප්‍රේම කළ බව සිහිකර බලන්න. අප තුළ යහපත් දෙයක් නොතිබුණු වටදී ද අප වැරදි වලින් සහ පාප වලින් මිය ගිය විටදී පවා උන්වහන්සේගේ මහත් වූ ප්‍රේමයෙන් අපට ප්‍රේම කළ සේක. උන්වහන්සේගේ නාමයට ප්‍රශංසා වේවා.

කුරුසිය මත

කුරුසියේ මරණයට පෙර යේසුස් වහන්සේ අපට ප්‍රේම කළ බව අපගේ ස්ථීර විශ්වාසයේ සහ ප්‍රීතිමත් විශ්වාසයේ කාරණයකි. ඒ මහත් වූ දවස සදාකාලික ගිනිවිලේ සහ සදාකාල ජීවිතයේ කේන්ද්‍රස්ථානය විය. එක් ගිවිසුමක අවසානය සහ ඊළඟ (අළුත්) ගිවිසුමේ ආරම්භය විය. සුර්යයා අඳුරු වූ නමුත් සදාකාලය බැබළෙන්නට වූ දිනය එයයි. පොළොව කම්පා වී ස්වර්ගය ස්ථාපිත වූ දිනය එයයි. මළවුන් නැගිට මනුෂ්‍යයන්ගේ සිතුවිලි අනාවරණය කරගත් දිනය එයයි. මනුෂ්‍යයාව පාපයෙන් මුදාගන්නා පිණිස ආදේශකය වූ උන්වහන්සේ සියලු මනුෂ්‍යයන්ගේ පාප උන්වහන්සේ පිටට ගෙන කල්වාරියට ගිය විට අනර්ඝ වූ ලෝකයක් ගොඩ නැගීමේ කොනේ ප්‍රධාන ගල වූ සේක. මුළු ලෝකයේ මනුෂ්‍යයාගේ පාපයේ බර උන්වහන්සේ මතට ගෙන එය දරාගනමින් මනුෂ්‍යයාගේ පාපයේ බර පහකළ සේක.

ඒ දවසේදී අප උදෙසා ඇති උන්වහන්සේගේ අනර්ඝ වූ ප්‍රේමය තහවුරු කළ සේක. කඳුළු සැලීමෙන් රතු වූ ඒ දෑස් දෙස බලා උන්වහන්සේ අපට ප්‍රේමකරන ආකාරය දෙස බලන්න. අපිරිසිදු කෙළවලින් අපිරිසිදුව වූ සහ සමච්චල් කරමින් ගසන ලද කම්මල් පහර වලින් තැළුණු ඒ කම්මුල් දෙස බලන්න. උන්වහන්සේ ආදරය දක්වන ආකාරය දෙස බලන්න. කටු ඔටුන්නේ කටු වලින් සිදුරුවූ ඒ ආදරණීය හිස දෙස බලන්න. ඒ අසමසම මුඛය දෙස බලන්න. ඒ දිව ඉතා වියළිව තිබෙන බවත්, ශෝකයේ වාසස්ථානය වන තරමටම අවලක්ෂණ වී ඇති උන්වහන්සේගේ මුහුණ දෙසත් බලන්න. මුළු ශරීරයම දැඩි ලෙස පීඩාවට පත්වී, වෙහෙසට ලක්ව ඇති ආකාරය දෙස බලන්න. මෘදු මොළොක්, කරුණාවන්ත දෑස් දෙස බලන්න. ලේ උල්පතේ කථාව එයයි. උන්වහන්සේගේ දෙපා දෙස බලන්න. එම ලේ ගංගා උන්වහන්සේගේ ආදරය කොයිතරම් ගැඹුරුදැයි ප්‍රකාශ කරයි. ඇත්ත වශයෙන්ම සොල්දාදුවෙකුගේ හෙල්ල පහරින් සිදුරු වූ උන්වහන්සේගේ ලැපැත්ත දෙස බලන්න. එම අනර්ඝ වූ ලේ සහ ජලධාරාව ද්විත්ව සහ අවිවාදිත බලයෙන් ප්‍රකාශ කරන්නේ යේසුස් වහන්සේගේ ප්‍රේමයයි. එදා අපි උපත ලබා තිබුණේ නැත. උන්වහන්සේ අපට මුලින්ම ප්‍රේම කළ සේක.

මැවීමට පෙර

එම නිසා මෙම පැරණි ග්‍රන්ථය අපට පවසන්නේ අපි නැවත ආපස්සට ගොස් බැලිය යුතු බවයි. අපේ මුල් දෙමව්පියන් ඒදන් උයනේදී අප සියල්ලන්වම පාපයට පංගුකාරයන් කළ විට උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක. සර්පයාගේ හිස පොඩි කිරීමට උන්වහන්සේ පැමිණෙන බවට පොරොන්දුවක් ලබා දුන් සේක. සැබවින්ම ලෝකය සහ එහි ඇති සියලුම දේ මැවීමට පෙර උන්වහන්සේ යෙහෝවා ලෙසින් තම සෙනඟට ආදරය කළ සේක. උන්වහන්සේගේ පෙර දැන ගැන්ම කරුණුකොටගෙන මනුෂ්‍යයාව දැක තිබූ සේක. උන්වහන්සේගේ පරමාධිපත්‍යයෙන් ඔවුන්ව (තම සෙනඟව) තෝරාගෙන, වෙන්කරගෙන තිබුණු සේක. උන්වහන්සේගේ අසීමිත කරුණාව ඔවුන්ව වෙන්කොට සැලකූ සේක. උන්වහන්සේගේ සදාකාලික අරමුණ ඔවුන්ව සදාකාලයටම උන්වහන්සේගේ වීමට නියමකර තිබූ සේක. උන්වහන්සේ මුලින්ම අපට ප්‍රේම කළ සේක. මෙය උන්වහන්සේට ප්‍රේම කිරීමට හේතුවක් නොවේ නම්, එවැනි හේතුවක් සොයාගගත හැකි වන්නේ කොතනින්ද .. ? උන්වහන්සේ මුලින්ම අපට ආදරය කළ සේක. සීතල හදවත්, කිරිගරුඬ පුවරු, කළුගල් කුට්ටි, අයිස් කඳු වැනි අපි දැන් දිය නොවන්නේ නම් දියවන්නේ කවදාද .. ? උන්වහන්සේ අපට ප්‍රේම කළා යන ඒ මහිමාන්විත සිතුවිල්ල අපගේ ගැඹුරුම ස්වභාවය හරහා දිව ගොස් එය පිරිසිදු කරනු ලබයි. එමෙන්ම අපව බබලන්නට සලස්වයි. අපි උන්වහන්සේට ප්‍රේම කළ යුතුය. මක්නිසාද උන්වහන්සේ මුලින්ම අපට ප්‍රේම කළ සේක.

පුදුම වූ ආදරය

උන්වහන්සේගේ ආදරය ගැන කථා කිරීමට මට වචන නැත. එය කොයිතරම් පුදුම වූ ප්‍රේමයක්ද කියනවා නම් උන්වහන්සේ අප වෙතට පැමිණීමට ස්වර්ගීය තේජස රාජකීයත්වය පසෙක තබා ලෝකයේ පාපය උන්වහන්සේ වෙතට ගත් සේක. එය කොයිතරම් කල්පවතින්නා වූ ප්‍රේමයක් ද කියනවා නම් කිසිම යුගයක, කිසිම දිනෙක එය අඳුරු නොකළ අතර එක් අංශුමාත්‍රයකින්වත් අඩු නොකළ සේක. එය කොයිතරම් පුදුම වූ ප්‍රේමයක් ද කියනවා නම් අපගේ අවිශ්වාසයේ සහ අපගේ පාපයේ දසදහස් ප්‍රතික්ෂේප කිරීම් එය නිවා දැම්මේ නැත. බොහෝ ජලයට එය නිවා දැමිය නොහැකිය. ගංවතුරට එය ගිල්වීමට නොහැකි විය.

එය කොයිතරම් ත්‍යාගශීලී ප්‍රේමයක් ද කියනවා නම් යේසුස් වහන්සේ අපට සියල්ල ලබා දුන් සේක. උන්වහන්සේම අපට උන්වහන්සේ සමඟ පංගුකාරත්වය ලබාදෙන සේක. අපව පවිත්‍ර කිරීමට උන්වහන්සේගේ ලේ වැගිරූ සේක. අපට පැළඳ ගැනීමට උන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ලබාදෙන සේක. අපගේ ආදර්ශය සඳහා උන්වහන්සේගේ ජීවිතය ද, අවසානයේ දී අපගේ විවේකය සඳහා උන්වහන්සේගේ සිංහාසනය ද දෙන සේක.

(චාර්ල්ස් එච් ස්පර්ජන් විසිනි.) (1843 - 1892)

උන්වහන්සේගේ ත්‍යාගශීලී ආදරය කිසිවක් ඉතුරුකර තබා නොගත් සේක. උන්වහන්සේගේ ආදරණීය වස්තුව වන තම සෙනඟ උදෙසා සියල්ල ලබාදෙන සේක. එය පරාර්ථකාමී ප්‍රේමයකි. උන්වහන්සේගේ දුක් වේදනා කොයිතරම් දරුණුද... ? උන්වහන්සේගේ ශෝකය කොයිතරම් භයානකද ... ? ඒ සියල්ල උන්වහන්සේගේ සතුරන් වූ අප සියල්ලන් දවන්නා වූ මිහිරි ප්‍රේමය වෙනුවෙන් දරාගත් සේක. එක මොහොතකට ගිණිදැල්ලක් මෙන් මාගේ ස්වාමීන් වහන්සේ ගැන කතා කිරීමට මට සෙරාප්වරුන්ගේ දිව තිබුණා නම් හොඳය. මට එය ලබාගත නොහැකි බැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයේ සාගරය මැනිය නොහැකි එකක් බව පැවසීමෙන් සෑහීමකට පත්විය යුතුය. එම ප්‍රේමයේ සම්පූර්ණයෙන්ම කිමිදෙමින් එයින් භෞතිස්මවීමටත්, ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත්වීමට සහ උන්වහන්සේ උදෙසා මරණයට පත්වීම ලාභයක් වීමටත් යාච්ඤා කරන්න.

සහෝදරයෙනි, ස්වාමීන් වහන්සේගේ ප්‍රේමය ඔබ කෙරෙහිත් ඔබ තුලත් වේවා .....! උන්වහන්සේගේ ප්‍රාණවත් ආත්මයේ බලයෙන් ඔබ ජීවත් වේවා.... !

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.